PDMO

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය | ශ්‍රී ලංකාව

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031

සහ

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2027

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ලේකම් කාර්යාලය (3 වන මහල)
කොළඹ 00100
ශ්‍රී ලංකාව
info@pdmo.gov.lk

PDMO

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය | ශ්‍රී ලංකාව

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය

උපායමාර්ගික සහ විචක්ෂණශීලී ණය කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශය

2027 -2031

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ලේකම් කාර්යාලය (3 වන මහල)
කොළඹ 00100
ශ්‍රී ලංකාව
info@pdmo.gov.lk

පටුන

1. විධායක සාරාංශය 1

2 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ සමාලෝචනය 2

2.1 නීතීමය රාමුව 2

2.2 ආයතනික රාමුව 2

2.3 ණය කළමනාකරණ අරමුණු 2

3.මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2

3.1 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ ණය ආවරණය 3

3.2 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 3

4. ආණ්ඩුවේ ණය කළඹෙහි වර්තමාන ව්‍යුහය 4

4.1 ආණ්ඩුවේ ණය සංයුතිය 4

4.2 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුවේ ණය 5

4.3 දැනට පවතින ආණ්ඩුවේ ණය පියවීමේ පැතිකඩ 5

4.4 වත්මන් ණය කළඹ තුළ අන්තර්ගත පිරිවැය සහ අවදානම 6

4.4.1. රාජ්‍ය ණය කළඹේ පොලී පිරිවැය 7

4.4.2. ප්‍රතිමූල්‍යකරණ අවදානම 8

4.4.3. පොලී අනුපාත අවදානම 8

4.4.4. විදේශ විනිමය අනුපාත අවදානම 9

5. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සහ රජයේ ණය තිරසරභාවය කෙරෙහි එහි බලපෑම 9

5.1. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ජයග්‍රහණ 9

5.1.1. ක්ෂණික මූල්‍ය සහනය සහ ණය අඩු කිරීම 9

5.1.2. ආර්ථික ස්ථාවරත්වය සහ රාජ්‍ය මූල්‍ය විනය 9

5.1.3. දේශීය ණය සහනය සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය 10

5.1.4. වැඩි දියුණු කළ විදේශ ණය තිරසරභාවය සහ විදේශ සංචිත තත්ත්වය 10

5.1.5 ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීමේ ප්‍රගතිය 10

5.2. ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම 11

5.2.1. ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට හේතු වූ සාධක 11

5.2.2 ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමේ බලපෑම 12

6. පාදක සාර්ව ආර්ථික උපකල්පන 12

6.1මෑතකාලීන සාර්ව ආර්ථික වර්ධනයන් සහ ඉදිරි දැක්ම 13

7. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 14

7.1 2031 වසර අවසානය වන විට ණය කළමනාකරණ ඉලක්ක 14

7.2 2027-2031 සඳහා මූල්‍යකරණ උපායමාර්ගය 15

7.3 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 18

7.4 සීමාවන් සහ අභියෝග 18

8. නිගමනය 19

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය: 2027 -2031

1. විධායක සාරාංශය

ශ්‍රී ලංකාව සිය ණය කළමනාකරණ පරිවයන් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම සඳහා ප්‍රධාන පරිවර්තනයකට එළඹ ඇත. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්මත කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම, ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණ මෙහෙයුම් ශක්තිමත් කිරීම සඳහා රජය ගෙන ඇති මෙම වැඩපිළිවෙලෙහි මූලික පදනම වේ. රටේ ණය තිරසරත්ව ඉලක්ක සපුරා ගැනීම සඳහා ශක්තිමත් නෛතික පසුබිමක් සහ මධ්‍යගත ආයතනික රාමුවක් පැවතීම අත්‍යවශ්‍ය වේ. ණය කළමනාකරණය ඉහළ නැංවීමට අදාළ මෙම ප්‍රතිසංස්කරණ මගින් ජාත්‍යන්තර ව පිළිගත් පරිවයන් හඳුන්වා දෙන අතර, රාජ්‍ය ණය කළමනාකරණයේදී පාරදෘශ්‍යභාවය, කාර්යක්ෂමතාව සහ උපායමාර්ගික සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කරයි.

රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ, වසර පහක චක්‍රීය පදනමක් මත මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයක් පිළියෙල කිරීමට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට බලතල පවරා ඇති අතර, එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු වේ. මෙම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වයට සහාය දක්වන අතරම, පිරිවැය සහ අවදානම සමබර කරමින් ආණ්ඩුවේ ණය තිරසර ලෙස කළමනාකරණය කිරීම සඳහා ව්‍යුහගත මාර්ග සිතියමක් සපයයි.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027–2031 ඉහත අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇත. එය ණය තිරසරභාවය ශක්තිමත් කිරීම මෙන්ම පොලී අනුපාතික අවදානම, ප්‍රතිමූල්‍යකරණ අවදානම සහ විදේශ විනිමය අවදානම වැනි අවදානම් අවම කිරීම කෙරෙහිත් අවධානය යොමු කරයි. වත්මන් ණය කළඹ විශ්ලේෂණය කිරීමේදී, කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් බහුලව පැවතීම හේතුවෙන් මතුවන ප්‍රතිමූල්‍යකරණ අවදානම, ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය අවම වීම හේතුවෙන් මතුවන පොලී අනුපාතික අවදානම සහ ණය කළඹේ පවතින විදේශ විනිමයෙන් නාමනය කරන ලද ඉහළ ණය ප්‍රමාණය මත මතුවන විදේශ විනිමය අනුපාතික අවදානම ප්‍රධාන අභියෝග ලෙස හඳුනාගෙන ඇත. රජයේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් ද තීරණාත්මක පිරිවැය දර්ශකයක් ලෙස හඳුනාගෙන තිබේ.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027- 2031 තුළින් ආණ්ඩුවේ ණය කළඹෙහි පිරිවැය සහ අවදානම යන කරුණු දෙකම විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම අරමුණු කරගනිමින් මූලික වශයෙන් සකස් කර ඇත. ඒ අනුව, එය 2027 සහ 2028 වසරවලදී එහි දළ ණය ගැනීමේ අවශ්‍යතාවලින් සියයට 88 ක් ශ්‍රී ලංකා රුපියල්වලින් නිකුත් කරන ණය උපකරණ මගින් ද, ඉතිරි සියයට 12 විදේශ විනිමය ණය උපකරණ මගින් ද සපයා ගැනීමට ද සම්පාදනය කර ඇත. අනතුරුව, විදේශීය මූල්‍යයනයන් සමඟ විචක්ෂණශීලී සමතුලිතතාවයක් පවත්වා ගනිමින්, රුපියල්වලින් ලබාගන්නා ණය අනුපාතය සියයට 85 දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම උපායමාර්ගය මගින් කෙටිකාලීන ණය මත රදා පැවතීම අවම කිරීමට අරමුණු කර ඇත. ඒ අනුව, භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය 2031 වසර වන විට සියයට 6.6 සිට සියයට 3.5 දක්වා ප්‍රතිශතයකට අඩු කිරීම, සාමාන්‍ය ණය කල්පිරීමේ කාලය වසර 6.6 සිට වසර 8 දක්වා 2031 වසර වන විට දීර්ඝ කිරීම, විදේශ විනිමයෙන් නාමනය කරන ලද ණය ප්‍රමාණය සියයට 41 සිට සියයට 30 දක්වා ප්‍රතිශතාත්මකව අඩු කිරීම සහ උපායමාර්ගික කාලසීමාව තුළ ආදායමට පොලී ගෙවීම් අනුපාතය සියයට 44.6 සිට සියයට 34 දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

එබැවින්, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027–2031 ඉදිරි වසර පහ තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ණය කළමනාකරණය සඳහා පැහැදිලි රාමුවක් ස්ථාපනය කරයි. දේශීය හා විදේශීය මූල්‍යකරණයේ විචක්ෂණශීලී සංයුතිය, ණය කල්පිරීමේ කාලය දීර්ඝ කිරීම සහ ප්‍රතිමූල්‍යකරණ, පොලී අනුපාතික හා විදේශ විනිමය අනුපාතික අවදානම් අවම කිරීම මගින් ණය තිරසරභාවය ශක්තිමත් කිරීමට, ණය ගැනීමේ පිරිවැය අඩු කිරීමට

සහ කාලානුරූපී ලෙස ණය සේවාකරණය තහවුරු කිරීමට මෙම උපායමාර්ගය තුළින් අපේක්ෂිතය.. ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාව සඳහා රජයේ කැපවීම, දේශීය ණය වෙළඳපොළ සංවර්ධනය කිරීම, වගකීම් කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ ආයෝජක විශ්වාසය ඉහළ නැංවීම ශ්‍රී ලංකාවේ දිගුකාලීන ණය තිරසරභාවය තහවුරු කිරීමට සාමූහිකව දායක වනු ඇත.

2. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ සමාලෝචනය

2.1 නීතිමය රාමුව

2024 වසරේ ජූනි මස 18 වන දින සම්මත කරන ලද 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යනු ජාත්‍යන්තර යහ පිළිවෙත්වලට අනුකූලව සකස් කරන ලද ඒකාබද්ධ ව්‍යවස්ථාපිත නීතියකි. මීට පෙර විවිධ පනත් සහ නීති මගින් විසිරී පැවති නෛතික ප්‍රතිපාදන වෙනුවට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වඩාත් විධිමත්, ඵලදායී සහ ඉදිරි දැක්මක් සහිත නෛතික රාමුවක් සපයමින්, රාජ්‍ය ණය කළමනාකරණයේ නවීන ක්‍රමවේදයන් මෙම පනත මගින් හඳුන්වා දෙනු ලබයි.

2.2 ආයතනික රාමුව

රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ 2024 වසරේ දෙසැම්බර් මස 02 වන දින රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරයි. එය පිහිටුවීමේ සිට, ආයතනික හැකියාවන් ගොඩනැගීම, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වූ අදාළ නියාමන පදනම් ස්ථාපනය කිරීම සහ නවීන ණය කළමනාකරණ පිළිවෙත් වර්ධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සුවිශේෂී ප්‍රගතියක් ලබා ඇත. මීට පෙර ආයතන කිහිපයක් පුරා විසිරී තිබූ රාජ්‍ය ණය කළමනාකරණයට අදාළ කාර්යයන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය යටතට ගෙන එන ලදී.

2.3 ණය කළමනාකරණ අරමුණු

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 3 වන වගන්තිය යටතේ රාජ්‍ය ණය කළමනාකරණ අරමුණු පහත පරිදි පැහැදිලිව නිර්වචනය කර ඇත:

අ. රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ ණය ගෙවීමේ වගකීම් කාලානුරූපීව පියවීම;

ආ. මධ්‍ය කාලීන සිට දිගු කාලීන කාලසීමාවක් තුළ විචක්ෂණශීලී අවදානම් මට්ටමකට අනුකූලව හැකිතාක් අවම පිරිවැයක් යටතේ ණය ගැනීම; සහ

ඇ. දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

3.මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය

රාජ්‍ය ණය කළමනාකරණ පනතෙහි 11 වන වගන්තියට අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් වක්‍රීය පදනමක් මත වසර පහක කාලයක් සඳහා මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කළ යුතු අතර, එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය රජයේ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සමඟ අනුකූල විය යුතු අතර, සාර්ව ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන්, වත්මන් රාජ්‍ය ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම්, විවිධ ණය හිමියන්ගෙන් මූල්‍ය පහසුකම් ලබාගැනීමේ හැකියාව සහ අනාගත ණය ගැනීමේ අවශ්‍යතා මෙන්ම ණය සේවාකරණ පිරිවැය කෙරෙහි බලපෑ හැකි අවදානම් තත්ත්වයන් ද සැලකිල්ලට ගනු ලබයි.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු උපායමාර්ගය පිළියෙල කරනු ලබන වසරේ විසර්ජන පනත් කෙටුම්පතෙහි දෙවන වර කියවීමට පසු නොවන පරිදි, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් ණය මට්ටම ස්ථාවරව සහ තිරසරව පවතින බව තහවුරු කරන අතරම, වඩාත් පිරිවැය කාර්යක්ෂම ලෙස ණය ලබා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරමින්, රජයේ මූල්‍ය අවශ්‍යතා කළමනාකරණය

කිරීම සඳහා වන උපායමාර්ගික මාර්ගෝපදේශයක් සපයයි.

3.1 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ ණය ආවරණය

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ ප්‍රතිපාදනයන්ට අනුව රාජ්‍ය ණය ලෙස;

- ආණ්ඩුවේ ණය
- රාජ්‍ය ව්‍යවසාය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල රජය විසින් සහතික කරන ලද හා සහතික නොකළ ණය ඇතුළත් වේ.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් ආණ්ඩුවේ සෘජු පාලනය යටතේ පවතින දේශීය හා විදේශීය ණය පමණක් ආවරණය කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සඳහා සලකා බලනු නොලැබේ.

3.2 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය, 2026-2030 යනු රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් සකස් කරන ලද දෙවන උපායමාර්ගය වන අතර 2026-2028 කාලපරිච්ඡේදය තුළ එක් එක් වසරේ සමස්ත දළ ණය ගැනීමේ අවශ්‍යතාවයෙන් සියයට 88 ක් පමණ දේශීය මූල්‍යයනයන් මගින් සපුරා ගැනීමට අපේක්ෂා කරමින්, දේශීය වෙළඳපොළෙන් ණය ලබා ගැනීම සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත. කල්පිරෙන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිමූල්‍යකරණය කිරීම සඳහා සහය වීම පිණිස 2029 වසරෙන් පසුව විදේශ විනිමය මූල්‍යකරණය ඉහළ නැංවීමට ද එමගින් අපේක්ෂා කරන ලදී.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026–2030 මගින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු කිරීම, දේශීය ණය කළඹෙහි කල්පිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම, ස්ථාවර පොලී අනුපාතික ණය ප්‍රතිශතය ඉහළ නැංවීම, සහ ප්‍රතිමූල්‍යකරණ හා පොලී අනුපාතික අවදානම් අවම කිරීම සඳහා වසරක් ඇතුළත නැවත පොලී අනුපාතික නියම වන ණය ප්‍රමාණය අඩු කිරීම යන කරුණු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කරන ලදී.

මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමෙන්, ණය පිරිවැය සහ අවදානම් දර්ශක කිහිපයක ප්‍රගතියක් ලබා ගැනීමට දායක වී ඇත. භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2025 වසර අවසානයේ පැවති සියයට 10.1 සිට 2026 වසර අවසානය වන විට සියයට 6.6 දක්වා අඩු කරන අතර, වසරක් ඇතුළත නැවත පොලී අනුපාතික නියම වන ණය ප්‍රතිශතය 26.8 සිට සියයට 24.1 දක්වා අඩු කිරීම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වසරක් ඇතුළත කල්පිරෙන ණය ප්‍රමාණය ද සියයට 17.0 සිට සියයට 12.4 දක්වා අඩු වූ අතර, රාජ්‍ය ආදායමට පොලී ගෙවීම් අනුපාතය සියයට 52.2 සිට සියයට 44.6 දක්වා යහපත් තත්ත්වයට පත් විය. 2026 වසරේ සැප්තැම්බර් මස 30 දක්වා කාලය තුළ වසර 3 සිට 15 දක්වා වූ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර 7.1 ක් පමණ වෙමින්, දේශීය ණය කළඹේ සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර 4.6 සිට වසර 4.7 දක්වා සුළු වශයෙන් ඉහළ නැංවීමට දායක විය. නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් අතුරින් සියයට 100 ක්ම ස්ථාවර පොලී අනුපාතික සහිත භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත වූ අතර, එය දේශීය ණය පොලී අනුපාතික අවදානම අඩු කිරීමට හේතු විය.

කෙසේ වෙතත්, විදේශ විනිමය ණය ප්‍රමාණය ඉහළ යාම, විදේශ විනිමය ණය කළඹෙහි ස්ථාවර පොළී අනුපාතික ණය ප්‍රමාණය අඩුවීම, සාමාන්‍ය කල්පිරීමේ කාලය අඩුවීම සහ සමස්ත ණය කළඹේ සාමාන්‍ය කල්පිරීමේ කාලය සුළු වශයෙන් පහත වැටීම තුළින් තවදුරටත් තීරණාත්මක අවදානමක් පවතින බව පෙන්නුම් කරයි.

විදේශීය අංශය දෙස බලන විට, 2026 වසරේ තුන්වන කාර්තුව වන විට නව බැඳීම් ණය අතුරින් සියයට 78.2 ක්ම පාවෙන පොලී අනුපාතික යටතේ පැවති අතර නව ණය ගැනීමේ සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර 21.3 ක් විය. කෙසේ වෙතත්, විදේශ ණය කළඹේ සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර 9.7 සිට වසර 8.9 දක්වා අඩු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසර අවසානයේ පැවති වසර 6.8 සිට සමස්ත ණය තොගයේ සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර 6.6 දක්වා අඩු වී ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල, 2026 වසර අවසාන දර්ශක මගින් කෙටි කාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානම් අවම කිරීම සහ ණය දැරීමේ හැකියාව වර්ධනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි. එසේ වුවද, සමස්ත ණය කළඹෙහි කල්පිරීමේ

කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීම, විදේශ විනිමය සඳහා නිරාවරණය වීම අවම කිරීම සහ මාධ්‍ය කාලීන පිරිවැය හා අවදානම් ඉලක්ක සපුරා ගැනීමට තවදුරටත් ප්‍රයත්නයන් දැරීමේ අවශ්‍යතාවය පවතී.

4.ආණ්ඩුවේ ණය කළඹෙහි වර්තමාන ව්‍යුහය

4.1 ආණ්ඩුවේ ණය සංයුතිය


2026 වසරේ ජූනි මස අවසාන වන විට, දේශීය හා විදේශීය ණය බැඳීම් ඇතුළත් ශ්‍රී ලංකාවේ සමස්ත ආණ්ඩුවේ ණය තොගය **ශ්‍රී ලංකා** රුපියල් බිලියන 31,999 කි. 2026 වසරේ ජූනි මාසය වන විට සමස්ථ ණය ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 60ක ප්‍රමාණයක් දේශීය ණය වලින් සමන්විත වන අතර පෙර වසරේ එම කාලය තුළදී එය සියයට 64 ක අගයක පැවතුණි. 2025 වසරේ ජූනි මස අවසානයේ සියයට 36 ක් ලෙස පැවති විදේශ ණය ප්‍රමාණය, 2026 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 40 දක්වා ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන ලෙස හේතු වී ඇත්තේ, මුදල් ප්‍රවාහ භාවිතා කරමින් භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් පියවීම නිසා මෙම කාල සීමාව තුළ දේශීය ණය තොගය **ශ්‍රී ලංකා** රුපියල් බිලියන 452 කින් අඩුවීම සහ විදේශීය ණය තොගය සඳහා විනිමය අනුපාතික සමානතා බලපෑම (Parity effect) ඇති වීමයි.

වගුව 01: පවතින රාජ්‍ය ණය තොගයේ සංයුතිය (ශ්‍රී ලංකා රුපියල් බිලියන)

	2025 ජූනි මස අවසානය වන විට	2026 ජූනි මස අවසානය වන විට
දේශීය ණය	**19,655**	**19,203**
භාණ්ඩාගාර බිල්පත්	3,921	2,372
භාණ්ඩාගාර බැදුම්කර	15,039	16,069
වෙනත්	695	762*
විදේශ ණය	**11,140**	**12,796**
බහු පාර්ශවීය	4,035	4,983
ද්වි පාර්ශවීය	3,300	3,635
වෙළඳපොළ ණය ගැනීම්	3,805	4,178
එකතුව	**30,795**	**31,999**


* රු.බිලියන 17ක දේශීය ඩොලර් බැදුම්කර ද ඇතුළත්ව

2026 වසරේ ජූනි මස අවසාන වන විට ණය උපකරණ අනුව ආණ්ඩුවේ ණය තොගයේ සංයුතිය 01 වන රූප සටහනෙහි දැක්වේ.



මූලාශ්‍රය-රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

4.2 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුවේ ණය



මූලාශ්‍රය- ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

e- ඇස්තමේන්තුගත

පසුගිය දශක හතක කාලය තුළ, ශ්‍රී ලංකාවේ සමස්ත ආණ්ඩුවේ ණය තොගය සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර, ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය 1950 වසරේ දී පැවති සියයට 17 සිට 2022 වසරේ දී සියයට 114.2 දක්වා වැඩිවී ඇත.

1977 වසරේ ආර්ථික ලිබරල්කරණයෙන් පසුව, විදේශීය ණය මත රජයේ රදා පැවැත්ම වේගයෙන් වර්ධනය වූ අතර, 1950–1976 කාල පරිච්ඡේදය තුළ සියයට 10 ක පමණ සාමාන්‍ය ප්‍රතිශතයකට සාපේක්ෂව, ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය අනුපාතය සියයට 30 ඉක්මවා යාමට හේතු විය. 1990 ගණන් වන විට, ශ්‍රී ලංකාවේ ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය අනුපාතය සියයට 50 ක් පමණ ලෙස ඉහළ ගොස් තිබුණි.

2000 දශකයේ මුල් භාගයේ සිට, මුළු ණය තොගය තුළ දේශීය ණය ප්‍රතිශතය ක්‍රමානුකූලව ඉහළ යන ලදී. 2010 වසර සහ 2018 වසර අතර කාල පරිච්ඡේදය තුළ සමස්ත ණය තොගය විශාල වශයෙන් පුළුල් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසර වන විට ශ්‍රී ලංකාවේ ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස දේශීය ණය අනුපාතය, ඉතිහාසයේ ඉහළ ම අගය කරා ළඟා විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලැබෙන විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවයේ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම මෙන්ම විවක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රමවේදයන් හේතුවෙන්, 2025 වසර අවසානය වන විට ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය සියයට 94.9 දක්වා (දළ පදනමින්) අඩු වී ඇති අතර, 2026 වසර අවසානය වන විට එය සියයට 89 මට්ටම දක්වා තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.


4.3 දැනට පවතින ආණ්ඩුවේ ණය පියවීමේ පැතිකඩ

ණය පියවීමේ පැතිකඩ මගින් ආණ්ඩුවේ දැනට පවතින ආණ්ඩුවේ ණයවල කල්පිරීමේ ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක සටහනක් පෙන්නුම් කරන අතර, එමගින් යම් කාලපරිච්ඡේදයක් තුළ ආණ්ඩුවේ ණය ගෙවිය යුත්තේ කවදාද, කොපමණ ප්‍රමාණයකින් ද යන්න නිරූපණය කරනු ලබයි.

2026 වසර අවසානයේදී, රුපියල් බිලියන 2,300ක් ලෙස ඇස්තමේන්තු කර ඇති නොපිය වූ භාණ්ඩාගාර බිල්පත් 2027 වසරේ දී ආපසු ගෙවීමට නියමිත අතර එමගින් රූප සටහන 03හි දැක්වෙන පරිදි කෙටිකාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානමක් පෙන්නුම් කළද, එම අවදානම ඵලදායී ආදායම් සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය තුළින් අවම කර ගත හැක.

2024, 2025 සහ 2026 වසරවල ආරම්භයේදී ද භාණ්ඩාගාර බිල්පත් තොගය පිළිවෙලින් රුපියල් බිලියන 4,092 ක්, රුපියල් බිලියන 4,070 ක් සහ රුපියල් බිලියන 3,138 ක් ලෙස පැවති අතර, රජය විසින් එම මුදල් ප්‍රමාණ සාර්ථකව ප්‍රතිමූල්‍යකරණය කිරීම හෝ ගෙවා නිම කිරීම සිදු කර ඇත.

රූප සටහන 03: 2026 වසර අවසානය සඳහා ඇස්තමේන්තුගත දැනට පවතින ආණ්ඩුවේ ණය නැවත පියවීමේ පැතිකඩ (රුපියල් බිලියන වලින් ඇස්තමේන්තු කරන ලද)



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

විදේශීය ණය, තුළ ශ්‍රී ලංකාව තුළ විදේශ මුදලින් (FX) ගිවිසුම් ගත කර ඇති ණය වලින් සමන්විත වේ.

දේශීය ණය වලින් ශ්‍රී ලංකා රුපියල්වලින් ලබාගත් නිරූපනය වේ ඇ- ඇස්තමේන්තුගත

වෙන් වෙන් වශයෙන් ගත් කල, දේශීය ණය පියවීමේ පැතිකඩ ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර වලින් සමන්විත අතර, 2028 වසරේ එය රුපියල් බිලියන 2,155 ක කල්පිරීමේ මධ්‍යස්ථ වර්ධනයක් අපේක්ෂා කරයි. 2022 වසරේ ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන්, ණය නිකුත් කිරීම් ඵලදායිතා වක්‍රයේ කෙටිකාලීන හා මධ්‍යකාලීන කාණ්ඩ වෙත සංකේන්ද්‍රණය වී ඇති අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස 2027-2035 කාලසීමාව තුළ බැඳුම්කර කල්පිරීම් ඉහළ අගයක් දක්නට ලැබේ. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය, වෙළඳපොළ ස්ථාවරත්වය සහ සාර්ව ආර්ථික දර්ශකවල මෑතකාලීන වර්ධනයන් සමඟ, ආයෝජක උනන්දුව ක්‍රමයෙන් මධ්‍යකාලීන සහ දිගුකාලීන කල්පිරීම් වෙත යොමු වෙමින් පවතී.

විදේශීය අංශය පිළිබඳව සලකන විට, නිල ණයහිමියන්ගේ කමිටුව සමඟ සිදු කරන ලද විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් අනාගත ණය ආපසු ගෙවීම් එක් කාල සීමාවක් තුළ සංකේන්ද්‍රණය වීමේ බලපෑම අවම වී ඇති අතර, එමගින් නුදුරු කාලීනව ගෙවීමට නියමිත විදේශීය ණය ඒකරාශි වීම අඩුවී ඇත. බැඳුම්කර හුවමාරුව යටතේ නිකුත් කරන ලද නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, විවිධ කොන්දේසි සහ කූපන් අනුපාත සහිත ක්‍රමානුකූලව ණය පියවීම් ව්‍යුහයක් අනුගමනය කරන අතර, එය විවිධාංගීකරණය වූ ණය කළඹක් සඳහා දායක වී ඇත. රූප සටහන් 03 හි දැක්වෙන පරිදි, ප්‍රතිව්‍යුහගත කරන ලද විදේශ ණයවල මූලික ණය මුදල් නැවත ගෙවීම් ආරම්භ වීම හේතුවෙන් විදේශ විනිමය ණය ආපසු ගෙවීම් 2028 වසරේ සිට ක්‍රමයෙන් ඉහළ ගොස් 2038 වසරේ දී උපරිම මට්ටමට ළඟා වී, ඉන් පසුව 2046 වසර දක්වා ක්‍රමයෙන් අඩු වනු ඇති බවට අපේක්ෂා කෙරේ.

4.4 වත්මන් ණය කළඹ තුළ අන්තර්ගත පිරිවැය සහ අවදානම

ආණ්ඩුවේ වත්මන් ණය කළඹ හා සම්බන්ධ පිරිවැය සහ අවදානම, ප්‍රධාන අවදානම් සහ පිරිවැය දර්ශක හරහා ඇගයීමට ලක් කර ඇත.

වගුව 02: පවතින ආණ්ඩුවේ ණය කළඹ තුළ අන්තර්ගත පිරිවැය සහ අවදානම - 2026 වසර අවසානය සඳහා පුරෝකථනය කර ඇති පරිදි

අවදානම් දර්ශක		විදේශ විනිමය මඟින් නාමනය කළ ණය	දේශීය විනිමය මඟින් නාමනය කළ ණය	මුළු ණය
ණය ප්‍රමාණය(රුපියල් බිලියන වලින්)		13,139.7	18,891.2	32,030.9
ණය ප්‍රමාණය (ඇමරිකානු ඩොලර් බිලියන වලින්)		38.1	62.1	100.2
නාමික ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස		36.5	52.5	89.0
ණය තොගයේ වර්තමාන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස [1]		34.7	52.5	87.1
ණය පිරිවැය [2]	දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් [3]	**1.4**	**6.0**	**7.4**
	ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම්	**8.4**	**36.2**	**44.6**
	බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතය (ප්‍රතිශතයක් ලෙස)	**3.8**	**11.3**	**8.2**
ප්‍රතිමූල්‍යකරණ අවදානම [2]	කල්පිරීමේ සාමාන්‍ය කාලය - (වසර)	**8.9**	**4.7**	**6.6**
	වසරක් තුළ දී කල්පිරෙන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	**3.6**	**20.5**	**12.8**
	වසරක් ඇතුළත කල් පිරෙන ණය ප්‍රමාණය (දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස)	**1.6**	**10.8**	**12.4**
පොලී අනුපාත අවදානම [3]	ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය - (වසර)	**7.2**	**4.5**	**5.7**
	වසරක් තුළ දී ප්‍රතිස්ථාවර වන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	**24.6**	**23.6**	**24.1**

අවදානම් දර්ශක		විදේශ විනිමය මඟින් නාමනය කළ ණය	දේශීය විනිමය මඟින් නාමනය කළ ණය	මුළු ණය
	භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව ස්ථාවර පොලී අනුපාත ණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	**78.0**	**96.5**	**88.1**
	භාණ්ඩාගාර බිල්පත් (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	**0.0**	**12.2**	**6.6**
විදේශ විනිමය අවදානම	විදේශ විනිමය ණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)			41.0
	කෙටිකාලීන විදේශ විනිමය ණය (විදේශ සංචිතවලින් ප්‍රතිශතයක් ලෙස)			19.7

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුවේ මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය විශ්ලේෂණාත්මක මෙවලම භාවිතයෙන් සකසන ලදී.

1 දළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වත්මන් වටිනාකම සහනදායී හෝ අර්ධ- සහනදායී කොන්දේසි යටතේ පවතින උපකරණ සඳහා සියයට 5ක වට්ටම් අනුපාතයක් යොදන ලද පුරෝකථනය කරන ලද ණය සේවා ගෙවීම් මත පදනම්ව ගණනය කරනු ලැබේ.


2 හරිත සාමාන්‍ය පොලී අනුපාතය, ප්‍රතිමූල්‍යකරණ සහ පොලී අනුපානික අවදානම් වැනි පුරෝකථනය කරනු ලබන මුදල් ප්‍රවාහ භාවිතා කරන පිරිවැය-අවදානම් දර්ශක සඳහා පුරෝකථන කරන ලද විදේශ විනිමය අනුපාත උපකල්පන යොදා ගනී

3 දළ දේශීය නිෂ්පාදිතයේ/ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම්, 2026 වසරේ නොපියවා ඇති ණය මත වන පොලී ගෙවීම් 2026 වසර සඳහා වන ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන්/ආදායමෙන් බෙදීම මඟින් ගණනය කර ඇත.

ණය කළඹේ පිරිවැය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සහ රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් මඟින් මනිනු ලැබේ. මේ අතර, ණය කළඹේ පවතින අවදානම් පහත විස්තර කර ඇති පරිදි ප්‍රතිමූල්‍යකරණ අවදානම, පොලී අනුපාත අවදානම සහ විදේශ විනිමය අනුපාත අවදානම යන පරාමිතීන් ඔස්සේ ඇගයීමට ලක් කෙරේ.

4.4.1. ආණ්ඩුවේ ණය කළඹේ පොලී පිරිවැය

බාහිර කම්පන හේතුවෙන්, නාමික පොලී ගෙවීම් 2020 වසරේ පැවති ශ්‍රී ලංකා රුපියල් බිලියන 980 ක පමණ අගයේ සිට 2026 වසර වන විට ශ්‍රී ලංකා රුපියල් බිලියන 2,617 දක්වා සැලකිය යුතු වැඩිවීමක් වනු ඇතැයි ඇස්තමේන්තුව කර ඇත. 2025 වසර අවසානයේදී පොලී ගෙවීම ශ්‍රී ලංකා රුපියල් බිලියන 2,501 ක් ලෙස වාර්තා වූ අතර, එය 2024 වසර අවසානය හා සැසඳීමේදී පොලී ගෙවීමේ අඩුවීමකි. මෙයට හේතු වූයේ දේශීය වෙළඳපොළේ පොලී අනුපාත පහළ යාමයි. කෙසේ නමුත්, 2026 වසරේ ඇස්තමේන්තුව හා සැසඳීමේ දී වර්ධනය වන ණය සේවාකරණ පිරිවැයක් පිළිඹිබු වේ. 2026 වසර සඳහා වන විදේශ ණය පොලී ගෙවීම් සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1,041 ක් (දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 343 ක්) ඇතුළත් වන අතර, එයින් ඇමරිකානු ඩොලර් මිලියන 670 ක් (දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 200 ක්) 2026.08.31 දින වන විට ගෙවා නිම කර ඇත.



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, , ජාතික අයවැය දෙපාර්තමේන්තුව

පොලී ගෙවීම් සහ ආදායම අතර අනුපාතය 2020 සහ 2023 අතර කාලය තුළ සියයට 70-81 අතර ප්‍රමාණයක පැවතුණු අතර, එමඟින් රජයේ ආදායමෙන් සැලකිය යුතු කොටසක් පොලී ගෙවීම් සඳහා වැය වූ බව පෙන්නුම් කරයි. 2023 වසරෙන් පසුව, ශක්තිමත් ආදායම් වර්ධනයක් ඔස්සේ අත්කරගත් රාජ්‍ය මූල්‍යය වර්ධනයෙහි සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අතරතුර පොලී ගෙවීම් පහළ යාමත් නිසා, මෙම අනුපාතය පහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, 2026 වසර අවසාන වන විට එය සියයට 44.6 කට ආසන්න ප්‍රමාණයක් දක්වා (පුරෝකථනය කළ පරිදි) අඩුවනු ඇත.

2025 වසර ආරම්භයේදී, පොලී ගෙවීම් සහ ආදායම අතර අනුපාතය සියයට 52.2 ක මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කරන ලදී. කෙසේ වෙතත්, පුරෝකථනය කළ පරිදි එය තවමත් රජයේ ආදායමෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන බැවින්, එය ආදායමෙන් සියයට 50 කට වඩා අඩු අගයක් දක්වා අඩු කිරීමට උපායමාර්ගිකව ඉලක්ක කරන ලදී. ආදායම් වර්ධනය සහ දේශීය වෙළඳපොළ ණය ගැනීමේ පිරිවැය පහළ යාමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, 2025 වසර අවසානය වන විට එය ආදායමෙන් සියයට 45.6 දක්වා සාර්ථකව අඩු කර ගැනීමට හැකි විය. දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවල ධනාත්මක බලපෑම් සමඟ, මෙම අසීරු තත්වය ක්‍රමයෙන් ලිහිල් වෙමින් පවතින අතර, පොලී ගෙවීම් සහ ආදායම අතර අනුපාතය වැඩි දියුණු වීමේ ලක්ෂණ පෙන්නුම් කරයි.

4.4.2. ප්‍රතිමූල්‍යකරණ අවදානම

මුළු ණය කළඹ අතුරින්, ප්‍රතිමූල්‍යකරණ අවදානම වඩාත් සංකේන්ද්‍රණය වී ඇත්තේ දේශීය ණය කළඹ තුළ වන අතර, 2026 වසරේ ජූනි මස අවසාන වන විට එය භාණ්ඩාගාර බිල්පත්වලින් සියයට 7.4 කින් සහ භාණ්ඩාගාර බැඳුම්කර සියයට 50.2 කින් සමන්විත වේ. දේශීය ණය කළඹේ ණය කල්පිරීමේ සාමාන්‍ය කාලය කෙටිවීමෙන් සහ වසරක් ඇතුළත කල්පිරීමට නියමිත ණයවල අනුපාතය ඉහළ අගයක් වීමෙන් පැහැදිලි ද්‍රවශීලතා සහ ප්‍රතිමූල්‍යකරණ අවදානමක් පෙන්නුම් කෙරේ. අර්බුදයෙන් පසු කාලපරිච්ඡේදය තුළ, දේශීය ණයවල කල්පිරීමේ පැතිකඩ දීර්ඝ කිරීම සඳහා උත්සාහයන් ගෙන ඇත. විශේෂයෙන්ම, ණය කළඹේ ප්‍රතිමූල්‍යකරණ අවදානම සැලකිය යුතු ලෙස අඩු කරමින් 2026 වසරේ දෙවන භාගයේදී, භාණ්ඩාගාර බිල්පත් සෘණ ශ්‍රී ලංකා රුපියල් බිලියන 700 ක ශුද්ධ ණය ගැනීමක් පෙන්නුම් කරයි. වෙළඳපොළ විශ්වාසය වර්ධනය වීම පිළිඹිබු කරමින්, මධ්‍යම සිට දිගු කාලීන රජයේ සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ රුචිකත්වයේ දියුණුවක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, 2026 වසරේ දෙවන කාර්තුවේ සිට මැදපෙරදිග අර්බුදයෙන් මතුවූ බාහිර කම්පන හේතුවෙන්, වසර 10 කට වැඩි දිගු කාලීන කල්පිරීම් කෙරෙහි අඩු හිතකර වෙළඳපොළ තත්ත්වයක් පෙන්නුම් කරයි.

ඊට ප්‍රතිවිරුද්ධව, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුළින් ලබා ගත් දිගු කල් පිරීමේ කාලයත් කෙටි කාලීන බැඳීම් අඩු වීමත් නිසා විදේශ ණය කළඹ විචක්ෂණශීලීව කළමනාකරණය කර ඇති බව පෙනේ. නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීන එක්සිම් බැංකුව ඇතුළු නිල ණය හිමියන් සමඟ සිදු කරන ලද විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම මඟින්, ආර්ථිකය යථා තත්ත්වයට පත් වන තෙක් ගෙවීම් කල් දැමීම මඟින් ශ්‍රී ලංකාවේ කෙටි කාලීන ණය බර ලිහිල් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් කාල සීමාව තුළ ගෙවීමට නියමිත එවැනි ණය සේවාකරණ සඳහා ශ්‍රී ලංකාවට සැලකිය යුතු ණය සහනයක් හිමි විය. ශ්‍රී ලංකාවට 2028 වසර දක්වා මූලික ණය සහන කාලයක් ලැබීම , පොලී අනුපාත අඩු කිරීම සහ 2043 වසරේ දී අවසන් ගෙවීම් සහිත සහනශීලී වාරික ගෙවීම් සැලැස්මක් ලැබී ඇත. ජාත්‍යන්තර ස්වෛරත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමෙන්, ශ්‍රී ලංකාව සාමාන්‍ය කල්පිරීමේ කාලය දළ වශයෙන් වසර 6 කින් පමණ දීර්ඝ කරගැනීමට සමත් වී ඇත.

4.4.3. පොලී අනුපාත අවදානම

නැවත පොලී නියම කිරීමේ සාමාන්‍ය කාලය කෙටි වීම සහ වසරක් ඇතුළත නැවත පොලී නියම කළ යුතු ණය කොටසෙහි විශාලත්වය වැඩිවීම හේතුවෙන් දේශීය ණය කළඹ, විදේශ ණය කළඹට වඩා ඉහළ පොලී අනුපාත අවදානමක් දරයි. මෙම අවදානමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ, වසරක් ඇතුළත කල් පිරෙන ඉහළ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය යි. භාණ්ඩාගාර බිල්පත් 2025 වසර අවසානයේ පැවති සියයට 10.1 ක අගයේ සිට 2026 වසරේ ජූනි මස අවසාන වන විට ක්‍රමයෙන් අඩු වී මුළු ණය කළඹෙන් සියයට 7.4 ක් නියෝජනය කරන නමුත්, එය තවමත් ප්‍රතිමූල්‍යකරණ සහ පොලී අනුපාත අවදානම් යන දෙකටම දායක වේ. කෙසේ වෙතත්, කෙටි කාලීන කල්පිරීමේ ව්‍යුහයක් පැවතිය ද, පොලී පිරිවැයෙහි ස්ථායිතාවයට සහය වන පරිදි, ණය උපකරණවල සැලකිය යුතු කොටසක් ස්ථාවර පොලී අනුපාතිකයන්ගෙන් සමන්විත වීම හේතුවෙන් මෙම අවදානමට නිරාවරණය වීම අර්ධ වශයෙන් සමනය වේ.


ඊට ප්‍රතිවිරුද්ධව, විදේශ ණය කළඹ තුළ විදේශ ණය කළඹෙන් සියයට 22 ක ප්‍රමාණයක් නියෝජනය වන පරිදි තරමක් ඉහළ විචල්‍ය පොලී අනුපාත සහිත ණය උපකරණ අඩංගු වුවද, එය සැලකිය යුතු තරම් දිගු නැවත පොලිය නියම කිරීමේ කාලයකින් සමන්විත

වන බැවින් ප්‍රතිමූල්‍යකරණය හෝ නැවත මිල නියම කිරීමේ අවශ්‍යතාවන්හි වාර ගණන අඩු කරයි. ඉදිරියේදී ඇතිවිය හැකි පොලී අනුපාත කම්පනවලට එරෙහිව නම්‍යශීලීභාවය ශක්තිමත් කිරීමට නැවත පොලී නියම කිරීමේ සාමාන්‍ය කාලය දීර්ඝ කිරීම කෙරෙහි උපායමාර්ගික අවධානයක් යොමු කිරීම සහ ස්ථාවර පොලී අනුපාත නිකුත් කිරීම් වලට ප්‍රමුඛතාව දීම අවශ්‍ය වනු ඇත.

4.4.4. විදේශ විනිමය අනුපාත අවදානම

වගුව 02හි දැක්වෙන පරිදි, විදේශ ව්‍යාවහාර මුදල්වලින් ලබා ගෙන ඇති ණය (මුළු ණය ප්‍රමාණයෙන් සියයට 41.0 ක්) සැලකිය යුතු ප්‍රමාණයක් පැවතීම හේතුවෙන්, ව්‍යුහාත්මක විදේශ විනිමය අවදානම ඉහළ මට්ටමක පවතී. විදේශ ණය කළඹෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඇමරිකානු ඩොලර්වලින් ද, සුළු ප්‍රමාණයක් ජපන් යෙන් , චීන යුවාන් සහ විශේෂ ආපසු ගැනුම් හිමිකමෙන් ද සමන්විත වේ. මෙම අවදානම පාලනය කිරීම සඳහා විවක්ෂණශීලී විනිමය අනුපාත කළමනාකරණයක් හැකි අවස්ථාවන්හි දී හෙජින් උපාය මාර්ග යොදා ගැනීමත් වැදගත් වේ. ණයවල විදේශ මුදල් සංයුතිය කළමනාකරණය කිරීම, විදේශ විනිමය සංචිත ගොඩනැගීම සහ දේශීය ණය වෙළඳපොළේ තත්වය වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩව දරනු ලබන උත්සාහයන් මගින් විදේශ විනිමය ආශ්‍රිත අවදානම් තවදුරටත් අවම කරනු ඇත.

රූප සටහන 05: 2026 ජූනි මස අවසාන වන විට මුදල් වර්ගය අනුව විදේශ ණය සංයුතිය (ප්‍රතිශතයක් ලෙස)



මූලාශ්‍රය- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

5. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සහ රජයේ ණය තිරසරභාවය කෙරෙහි එහි බලපෑම

5.1. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ජයග්‍රහණ

2022 වසරේ වූ ආර්ථික අර්බුදයෙන් පසු සිය ආර්ථිකය ස්ථාවර කර ගැනීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයේදී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. ප්‍රතිව්‍යුහගත කිරීම ක්ෂණික මූල්‍ය සහනයක් මෙන්ම දිගුකාලීන ප්‍රතිලාභ ද ලබා දුන් අතර, රටෙහි රාජ්‍ය ණයවල ගමන් මග සැලකිය යුතු ලෙස වෙනස් කරමින් රාජ්‍ය මූල්‍ය හා ආර්ථික ස්ථාවරත්වය කරා යන මාවත විවර කළේය.

5.1.1. ක්ෂණික මූල්‍ය සහනය සහ ණය අඩු කිරීම

ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් රටේ ප්‍රතිව්‍යුහගත කරන ලද ණයවල වර්තමාන වටිනාකම සියයට 41 කින් අඩු කිරීමෙන් ණය බර සැලකිය යුතු ලෙස ලිහිල් විය. මෙම අඩුකිරීම මඟින් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නිර්මාණය කරන ලද අතර, එමඟින් තීරණාත්මක සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන් සඳහා අරමුදල් වෙන් කිරීමට රජයට හැකි විය.

ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය 2027 සිට 2032 වසර දක්වා කාලය තුළ දී වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ක උපරිමයකට සීමා කර සැලකිය යුතු සහනයක් ලබා දීමෙන් රජයට සිය රාජ්‍ය මූල්‍ය වගකීම් වඩාත් හොඳින් කළමනාකරණය කිරීමට ඉඩ සැලසීමත් සිදුවුණි. ණය ගෙවීම් පැහැර හැරීම් වැළැක්වීමටත්, සමාජ සේවා හා යටිතල පහසුකම් වැනි අත්‍යවශ්‍ය අංශවල ආයෝජන සක්‍රීය කිරීමටත් මෙම අඩු කිරීම ඉතා වැදගත් වේ.

5.1.2. ආර්ථික ස්ථාවරත්වය සහ රාජ්‍ය මූල්‍ය විනය

ණය ප්‍රතිව්‍යුහගත කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදලේ පහසුකමට අනුකූල වූ අතර, එය රාජ්‍ය මූල්‍ය විනය සඳහා පැහැදිලි ඉලක්ක ලබා දීමට උපකාරී විය. ප්‍රධාන අරමුණු අතර 2032 වසර වන විට රාජ්‍ය ණය කළඹ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95 දක්වා අඩු කිරීම සහ 2027 සිට 2032 කාලය තුළ වාර්ෂිකව දළ මූල්‍ය අවශ්‍යතා දළ දේශීය

නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම ඇතුළත් වේ.
සාර්ව සම්බන්ධිත බැඳුම්කර සහ පාලන සම්බන්ධිත බැඳුම්කර හඳුන්වා දීම ණය සේවාකරණයේ නම්‍යශීලී බව තවදුරටත් තහවුරු කළ අතර රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සඳහා පෙළඹවීමක් ද ඇති කළේය. සාර්ව සම්බන්ධිත බැඳුම්කර ණය ගෙවීම්, ආර්ථික කාර්ය සාධනයට සම්බන්ධ වන අතර, රාජ්‍ය මූල්‍ය සහ පාලන ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගන්නේ නම් පාලන සම්බන්ධිත බැඳුම්කර හරහා අමතර සහනයක් ලබා දෙනු ඇත.

5.1.3. දේශීය ණය සහනය සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය

2023 වසරේ දී සිදු කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණය මඟින් මූල්‍ය පද්ධතිය අස්ථාවර නොකර දේශීය මූල්‍යකරණය මත ඇති වන පීඩනය සමනය කිරීමෙහි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම වැඩසටහන කල්පිරෙන කාල සීමාවන් දීර්ඝ කිරීම සහ පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ දැමීමේ ව්‍යුහයක් (step-down coupon structure) හරහා ආණ්ඩුවේ ණය සේවාකරණ පිරිවැය අඩු කිරීමට සහ ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කිරීමට මෙම වැඩසටහන දායක විය. එමඟින් ණය තිරසරභාවයට සහය වෙමින් මධ්‍යකාලීන ණය පැනිකඩ ශක්තිමත් කිරීමට ඉවහල් විය.

මෙම ක්‍රියාමාර්ග මඟින් 2023-2027 අතර කාලය තුළ දේශීය මූල්‍ය අර්බුදයක් ඇති වීම වළක්වාලමින් වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් දේශීය ණය සේවාකරණය ප්‍රතිශතාත්මකව සියයට 1.2 කින් අඩු කර ඇත. (ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගතකරණය: සංකීර්ණ ක්‍රියාවලීන්ගෙන් උගත් පාඩම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල , 2025 සැප්තැම්බර්)

5.1.4. වැඩි දියුණු කළ විදේශ ණය තිරසරභාවය සහ විදේශ සංචිත තත්ත්වය

මෙම ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් 2023-2027 කාලය තුළ ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 17 ක ණය සේවා සහනයක් හිමි වූ අතර, එය ගෙවුම් ශේෂ පීඩනයන් ලිහිල් කිරීමට සහ විදේශ විනිමය සංචිත වැඩිදියුණු කිරීමට ඉතා තීරණාත්මක දායකත්වයක් සපයා ඇත. 2027-2032 කාල සීමාව තුළ වාර්ෂිකව විදේශ විනිමය ණය සේවාකරණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ක සීමාවක් තුළ පවත්වාගෙන යාම පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිලිබඳව ඉලක්කය, රටේ විදේශ ණය සේවාකරණය සහ විදේශ විනිමය සංචිත තත්ත්වය තිරසර ලෙස පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

5.1.5 ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීමේ ප්‍රගතිය

2026 වසරේ අගෝස්තු මස වන විට, ශ්‍රී ලංකාව සිය විදේශ ණය හිමියන්ගෙන් සියයට 99 කට ආසන්න ප්‍රමාණයක් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොන්දේසි සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණ ඇති අතර, රාජ්‍ය විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් සියයට 94 කට වඩා වැඩි ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර, චීන සංවර්ධන බැංකුව සහ චීන එක්සිම් බැංකුව සතු ණය ප්‍රතිව්‍යුහගත කිරීම් ක්‍රියාත්මක කර ඇති අතර, නිල ණය හිමියන්ගේ කමිටුවේ සාමාජිකයින් සමඟ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.3 ක් ආවරණය වන පරිදි ද්විපාර්ශ්වික ගිවිසුම් එකොළහක් අවසන් එකඟතාවයකට එලඹෙමින්, ඉන් ගිවිසුම් දහයක් අත්සන් කර ඇත. ඉතිරි ද්විපාර්ශ්වික ගිවිසුම් අත්සන් කිරීම සහ තව දුරටත් ඉතිරිව පවතින සුළු කරුණු කිහිපයක් ක්‍රියාත්මක කිරීම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නිමා කිරීම සඳහා ගත යුතු අවසාන පියවර වේ. (වගුව 03).

ප්‍රතිව්‍යුහගත කිරීම සැකෙවින් (2026 අගෝස්තු)

- **විදේශ ණය හිමියන්ගෙන් සියයට 99 කට ආසන්න ප්‍රමාණයක් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොන්දේසි සඳහා එකඟතාව පල කර ඇත.**
- **රාජ්‍ය විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සියයට 94 කට වඩා වැඩි ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත.**
- **නිල ණය හිමියන්ගේ කමිටුවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.3 ක ද්විපාර්ශ්වික ගිවිසුම් අවසන් කර ඇත (ගිවිසුම් 11 න් 10 ක් අත්සන් කර ඇත); ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර , චීන ආනයන- අපනයන බැංකුව සහ චීන සංවර්ධන බැංකුවල ප්‍රතිව්‍යුහගත කිරීම් නිමා කර ඇත.**

වගුව 03: රාජ්‍ය විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ තත්ත්වය (2026 අගෝස්තු මස වන විට)

ණය හිමි කණ්ඩායම	2025 අවසානයට නොපියවා ඇති ශේෂය (ඇ.ඩො.මිලියන)	තත්ත්වය
නිල ණය හිමියන්ගේ කමිටුව (සාමාජිකයින් 17)	5,812	ණය ප්‍රතිව්‍යුහගතකිරීම් කොන්දේසිවලට එකඟ වී ඇත; ද්විපාර්ශ්වික ගිවිසුම් 11 ක් අවසන් කර ඇත (ඇමරිකානු ඩොලර් බිලියන 4.3), ඒ අතුරින් 10 ක් අත්සන් කර ඇත; සාමාජිකයින් 6 දෙනෙකු සමඟ සාකච්ඡා තවදුරටත් සිදු කරමින් සිටී.
චීන එක්සිම් බැංකුව	4,225	ක්‍රියාත්මක කිරීම අවසන් කර ඇත
අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල සහ කුවේට් අරමුදල	291	ක්‍රියාත්මක කිරීම අවසන් කර ඇත
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISBs)	10,255	ක්‍රියාත්මක කිරීම අවසන් කර ඇත
චීන සංවර්ධන බැංකුව	3,222	ක්‍රියාත්මක කිරීම අවසන් කර ඇත
ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගමේ බැඳුම්කර	175	ක්‍රියාත්මක කිරීම අවසන් කර ඇත
වෙනත් අපනයන ණය ඒජන්සි ඇපකර ලත්, ද්විපාර්ශ්වික සහ වාණිජ ණය	~235	ණය මුදලින් කොටසක් සඳහා කොන්දේසිවලට එකඟ වී ඇත; ඉතිරි කොටස සඳහා සාකච්ඡා පැවැත්වීම සහ ණය ගිවිසුම් කෙටුම්පත් කිරීම සිදු කෙරෙමින් පවතී.
සහභාගී නොවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන්	~250+	අධිකරණ කටයුත්තක් පවතී

මූලාශ්‍රය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව (ආයෝජක හමුව, 2026 අගෝස්තු 10) ගෙවිය යුතු හිඟ පොලී ප්‍රමාණයන් අඩංගු නොවන අතර රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වූ ඇපකර ලත් ණය ඇතුළත් වේ.

5.2. ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම

ශ්‍රී ලංකාව විසින් සාර්ථකව සිදු කරන ලද ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම අනුමත වීමෙන් පසුව, 2024 වසරේ අගභාගයේදී, 2025 සහ 2026 වසරවලදී ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම්වල සැලකිය යුතු ඉහළ නැංවීමක් දක්නට ලැබුණි. ෆිච් රේටින්ග්ස් , මුඩීස් රේටින්ග්ස් සහ එස් ඇන්ඩ් පී ග්ලෝබල් රේටින්ග්ස් මඟින් සිදු කරන ලද මෙම ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම් මඟින්, 2022 වසරේ ස්වෛරීත්ව ණය ගෙවීම් නවතා දැමීමෙන් පසුව ආර්ථිකය ස්ථායී කිරීමට, ණය පැහැර හැරීමේ අවදානම අඩු කිරීමට සහ මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රට දරන උත්සාහයන් පිළිඹිඹු කරයි. 2026 වසරේ සැප්තැම්බර් 22 දින ෆිච් ආයතනය විසින් ශ්‍රේණිගත කිරීම "B-" දක්වා ඉහළ නැංවීම, ණය ගෙවීම් නවතා දැමීමෙන් පසුව ප්‍රධාන ශ්‍රේණිගත කිරීමේ ඒජන්සි තුන අතුරින් එකක් මඟින් single-B කාණ්ඩය වෙත සිදු කරන ලද පළමු ඉහළ නැංවීම වේ.

5.2.1. ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට හේතු වූ සාධක

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ පෙන්නුම් කරන ලද ශක්තිමත් කාර්ය සාධනය : 2023 වසරේ මාර්තු මාසයේදී අනුමත කරන ලද, ඇමරිකානු ඩොලර් බිලියන 3 කට ආසන්න මූල්‍ය පහසුකමක් සහිත මාස 48 ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම සාර්ථකව ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව ඇති විශ්වාසනීයතාවය ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සහ තීරණාත්මක ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තුළින් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීමට මෙම වැඩසටහන සහය වී ඇත. 2026 මැයි මාසයේදී පස්වන සහ හයවන සමාලෝචන අවසන් කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව වෙත ලැබී ඇති සමස්ත මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 2.4 කට පමණ ඉහල ගොස් ඇති අතර 2026 වසරේ ඔක්තෝබර් මාසයේදී සත්වන සමාලෝචනය සඳහා වන කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයට එළඹෙන ලදී.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම සහ ඒ සමඟ ම සාර්ව ආර්ථික මූලිකාංග වැඩි දියුණු වීම: ණය ප්‍රතිව්‍යුහගතකිරීමේ ක්‍රියාවලිය සාර්ථකව අවසන් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ණය තිරසරභාවය පිළිබඳ අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇති අතර ආයෝජක විශ්වාසයද වැඩිදියුණු වී ඇත. එම ක්‍රියාවලිය තුළින් ලැබුණු ණය සේවාකරණ සහනයන් සහ ඒ සමඟින්ම වැඩි දියුණු වූ සාර්ව ආර්ථික මූලිකාංගවල බලපෑම හේතුවෙන් රටෙහි ණය

පිළිබඳව වගකීම් නියමිත පරිදි පියවීමේ හැකියාව වර්ධනය වී ඇත.

5.2.2 ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමේ බලපෑම

මෙම ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම් මඟින් ඉදිරි අනාගතයේ සිදුවිය හැකි ණය පැහැර හැරීමේ අවදානම අඩු කරන අතර ජාත්‍යන්තර වෙළඳපොළවල් වෙත ප්‍රවේශ වීම සඳහා වන ධනාත්මක ප්‍රවේශයක් පෙන්නුම් කරයි.

තවද මෙම ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම මගින් රටේ ණය කළමනාකරනය පිලිබඳව ඉදිරි දැක්ම වැඩි දියුණු වී ඇති බව පෙන්නුම් කරන අතර ඉදිරි දශකය තුළ ද.දේ.නීට සාපේක්ෂව රාජ්‍ය ණය අනුපාතය පහළ යනු ඇතැයි අපේක්ෂා කිරීමත් සමග මෙම වර්ධනයන් ආයෝජකයින්ගේ ආකල්ප කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරමින් ශ්‍රී ලංකාවට සිය ණය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිලිබඳව විශ්වාසය තව දුරටත් ශක්තිමත් කරනු ඇත. කෙසේ වෙතත්, මෙම ශ්‍රේණිගත කිරීම් තවදුරටත් සමපේක්ෂණ මට්ටමේ බාණ්ඩය තුළ පවතී. ෆිච් ආයතනය 2026 වසරේ දී ආණ්ඩුවේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 92.9 ක් ලෙස ඇස්තමේන්තු කරන අතර, එය 'B-' ශ්‍රේණිගත කිරීමක් සහිත සම තත්වයේ රටවල මධ්‍ය අගයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ වන අතර රජයේ ආදායමෙන් සියයට 40 කට වඩා වැඩි ප්‍රමාණයක් පොලී පිරිවැය සඳහා පමණක් වැය වන බවත් ණය දරාගැනීමේ හැකියාව දුර්වල මට්ටමක පවතින බවත් මුඩීස් ආයතනය මඟින් පෙන්වා දෙයි. ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ කිරීමේ ප්‍රගතිය, සංචිත එකතු කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම මෙම ඉදිරි ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම් සඳහා ප්‍රධාන ලෙස සාධක වනු ඇත.

වගුව 04: ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් - 2026 වසරේ ඔක්තෝබර් මස වන විට

ශ්‍රේණිගත කිරීමේ ඒජන්සිය	දිගු කාලීන විදේශ විනිමය ශ්‍රේණිගත කිරීම	ඉදිරි දැක්ම	නවතම ක්‍රියාමාර්ගය
ෆිච් රේටින්ග්ස්	B-	ස්ථාවර	2026 සැප්තැම්බර් 22 දින CCC+ තත්ත්වයේ සිට ඉහළ නංවන ලදී.
මුඩීස් රේටින්ග්ස්	Caa1	ස්ථාවර	2026 අගෝස්තු මාසයේදී තහවුරු කරන ලදී; 2024 දෙසැම්බර් මාසයේදී Ca තත්ත්වයේ සිට ඉහළ නංවන ලදී.
එස් ඇන්ඩ් පී ග්ලෝබල් රේටින්ග්ස්	CCC+	ස්ථාවර	2025 සැප්තැම්බර් මාසයේදී SD සිට ඉහළ නංවන ලද ශ්‍රේණිගත කිරීමෙන් පසුව කිසිදු වෙනසක් සිදු කර නොමැත

මූලාශ්‍රය: ෆිච් රේටින්ග්ස් ,මුඩීස් රේටින්ග්ස්, එස් ඇන්ඩ් පී ග්ලෝබල් රේටින්ග්ස්

6. පාදක සාර්ව ආර්ථික උපකල්පන

ආර්ථික වර්ධනය, උද්ධමනය, රාජ්‍ය මූල්‍ය තුලනය සහ විනිමය අනුපාතයන් පිළිබඳව පුරෝකථනය කරනු ලබන රටේ ශක්තිමත් සාර්ව ආර්ථික රාමුවක් මත ණය කළමනාකරණ උපායමාර්ගයේ ශක්‍යතාවය බෙහෙවින් රඳා පවතී. ණය කළමනාකරණ උපායමාර්ගය සහ සාර්ව ආර්ථික රාමුව අතර පවතින අන්‍යෝන්‍ය අන්තර් සබඳතාවය සලකා බලන විට, උපායමාර්ග ද්විත්වය අතර අනුකූලතාව පවත්වා ගැනීම ඉතා තීරණාත්මක වේ.

එබැවින්, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031, මධ්‍ය කාලීන මූල්‍ය රාමුව 2027-2031 සහ 2027 වසර සඳහා වන වාර්ෂික අයවැය පුරෝකථන යටතේ අර්ථ දක්වා ඇති සාර්ව මූල්‍ය රාමුව සමඟ අනුකූල වන පරිදි සකස් කර ඇත. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කිරීම සඳහා, මූලික සාර්ව ආර්ථික දැක්මට අදාල අවදානම් සහ ණය කළමනාකරණ උපායමාර්ගය කෙරෙහි ඒවායේ ඇති කළ හැකි බලපෑම් උපායමාර්ගික කාලපරිච්ඡේදය පුරාම ස්ථාවර පවතින බව උපකල්පනය කර ඇත. මධ්‍ය කාලීන විනිමය අනුපාතය පුරෝකථනය කිරීම සඳහා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව සඳහාවන උද්ධමන පුරෝකථන සලකා බලනු ලබන ක්‍රයශක්ති සමානාත්මතා ආකෘතිය භාවිතා කර ඇත. සෝෆා අනුපාතය (Secured Overnight Financing Rate) බ්ලූම්බර්ග් (Bloomberg) පුරෝකථන මත පදනම්ව

පුරෝකථනය කර ඇති අතර, දේශීය භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන පොලී අනුපාත පුරෝකථනය කර ඇත්තේ රටේ උද්ධමන ඉලක්ක සහ නිල ප්‍රතිපත්ති අනුපාතයන්ට අනුව වෙළඳපොළ අනුපාතිකයන්ගේ දිශානතියේ ප්‍රවණතාව සලකා බලමිනි.

සාර්ව මූල්‍ය රාමුව 2027-2031, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අර්ථ දක්වා ඇති ණය අඩු කිරීමේ සහ ණය තිරසරභාවය පවත්වාගෙන යාමේ අරමුණ සමග අනුකූල වන පරිදි සකස් කර ඇත. මෙම ඉලක්ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම ගිවිසුම යටතේ ලබා දී ඇති ණය තිරසරත්ව ඉලක්ක සමඟ සමපාත වේ:

1. 2032 වසර වන විට රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 95 ට වඩා පහළ මට්ටමකට අඩුකිරීම.
2. 2027 වසරේ සිට 2032 වසර දක්වා කාලය තුළ මධ්‍යම රජයේ වාර්ෂික දළ මූල්‍ය අවශ්‍යතාවයන් සාමාන්‍ය වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.
3. 2027 වසරේ සිට 2032 වසර දක්වා කාලය තුළ සෑම වසරකදී ම මධ්‍යම රජයේ විදේශ විනිමයවලින් සිදු කල යුතු ණය සේවාකරණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.

6.1 මැතකාලීන සාර්ව ආර්ථික වර්ධනයන් සහ ඉදිරි දැක්ම

2025 වසරේ නොවැම්බර් මාසයේ ඇති වූ 'දිට්වා' සුළි කුණාටුව සහ 2026 වසරේ පෙබරවාරි මස අග භාගයේ සිට මැදපෙරදිග ගැටුම් උග්‍රවීම වැනි අඛණ්ඩ කම්පන තත්වයන් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය සැලකිය යුතු ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කර ඇත. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2025 වසරේ දී සියයට 5.0 කින් පමණ වර්ධනය වූ අතර 2026 වසරේ පළමු කාර්තුවේදී වාර්ෂික පදනම මත සියයට 5.1 කින් සහ 2026 දෙවන කාර්තුවේදී සියයට 4.2 කින් ද වර්ධනය වී, කාර්තු දොළහක වර්ධනයක් වාර්තා කර ඇත. ඉහළ බලශක්ති මිල ගණන් සහ සංචාරක කර්මාන්තයට එල්ල වූ බාධාවන් හේතුවෙන් 2026 වසර සඳහා වන ඉදිරි දැක්ම තරමක් දුර්වල වූවද, 2026 වසර අවසානයේදී ශ්‍රී ලංකාව සියයට 3.8 සැබෑ ආර්ථික වර්ධනයක් ලඟාකරගනිමින්, එය 2027 වසර වන විට සියයට 4.0 දක්වා ඉහළ යමින් මධ්‍යකාලීනව සියයට 4.1 ක පමණ මට්ටමක ස්ථාවර වීමක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2025 වසරේ දී සාමාන්‍යයක් ලෙස සියයට -0.5 ක් වූ සමස්ත උද්ධමනය, බලශක්ති කම්පනය ආර්ථිකයේ ක්ෂේත්‍ර කිහිපයකට බලපෑම හේතුවෙන් 2026 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී සියයට 8 දක්වා ඉහළ ගිය ද, එය මහ බැංකුවේ සියයට 5 ක උද්ධමන ඉලක්කය ඉක්මවා ගොස් තිබුණ ද, උද්ධමන පිළිබඳව අපේක්ෂාවන් සමස්තයක් ලෙස ස්ථාවර මට්ටමක පවතී. 2026 වසරේ අගෝස්තු මස අවසාන වන විට දළ නිල විදේශ සංචිත[4] ඇමරිකානු ඩොලර් බිලියන 6.9 ක් ලෙස ඉහළ ගොස් ඇත (2026 වසරේ ජූනි මස අවසානයේදී එය ඇමරිකානු ඩොලර් බිලියන 6.5 ක් විය). රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ දී, මධ්‍යම රජය 2025 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.4 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගත් අතර, එය වැඩසටහන් ඉලක්කය වූ සියයට 2.3 ට වඩා බෙහෙවින් ඉහළ අගයකි. තාවකාලික සහන පැකේජය සහ සුළි කුණාටු ප්‍රතිසංස්කරණ වියදම් පැවතිය ද, 2026 වසර සඳහා ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.6 ක් ලෙසත්, මධ්‍ය කාලීනව සියයට 3.0 ක අගයකත් පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

4 *චීන මහජන බැංකුව වෙතින් ලබාගෙන ඇති ජාත්‍යන්තර මුදල් හුවමාරු පහසුකමද ඇතුළත් වේ.*

සාර්ව ආර්ථික සංක්ෂිප්තය

- **ආර්ථික වර්ධනය:** 2026 වසර සඳහා පුරෝකථනය සියයට 3.8 කි.(2025 වසරේ දී සියයට 5.0 ක් විය). 2027 වසර වන විට සියයට 4.0 දක්වා යථා තත්ත්වයට පත්වනු ඇත.
- **උද්ධමනය:** සියයට 5 ක ඉලක්කයට එරෙහිව 2026 වසර අගෝස්තු- සැප්තැම්බර් මාසවලදී සියයට 8 ක් විය.
- **සංචිත:** 2026 වසරේ අගෝස්තු මස අවසානයේදී ඇමරිකානු ඩොලර් බිලියන 6.9 ක් විය.
- **ප්‍රාථමික අතිරික්තය:** 2026 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.6 කි.

වගුව 05: පාදක සාර්ව ආර්ථික පුරෝකථන

දර්ශකය	2026 F	2027 F	2028 F	2029 F	2030 F	2031 F
මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයේ ප්‍රතිශතයක් ලෙස [5]	3.8	4.0	4.1	4.1	4.2	4.2
උද්ධමනය, සාමාන්‍ය කොළඹ පාරිභෝගික මිල දර්ශකය [6] (සියයට)	5.4	4.7	5.1	5.0	5.0	5.0
නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (සියයට) [5]	10.0	8.2	8.3	8.4	8.5	8.7
ප්‍රාථමික ශේෂය [5]	3.6	2.3	3.0	3.0	3.0	3.0
දළ ජාත්‍යන්තර සංචිත (ඇමෙරිකානු ඩොලර් මිලියන) [7]	8,645	11,779	13,939	14,474	14,746	14,985

මූලාශ්‍රය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. ශ්‍රී ලංකා මහ බැංකුව

5. සංශෝධිත මධ්‍යකාලීන මූල්‍ය රාමුව මත පදනම්ව
6. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් 2026 වසරේ සැප්තැම්බර් 09 දිනට කොරතුරු මත පදනම්ව
7. 2026 වසරේ මැයි මාසයේ ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩල වාර්තාව මත පදනම්ව

සාර්ව ආර්ථික පසුබිම තුළ, රාජ්‍ය ණය ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව පහළ යන ප්‍රවණතාව හේතුවෙන් මූල්‍යකරණ පිරිවැය අඩු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට රජයට හැකියාව ලැබෙනු ඇත. දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ අවදානම් පිළිබඳ විවක්ෂණශීලී මට්ටමක් පවත්වාගනිමින්, පිරිවැය කාර්යක්ෂම මූලාශ්‍රවලින් අරමුදල් සුරක්ෂිතකිරීම කෙරෙහි අවධානය යොමුකරන ණය කළමනාකරණ උපාය මාර්ගයේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස ණය තිරසරත්ව ඉලක්ක සපුරාගැනීමට රජය අපේක්ෂා කරයි.

7. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව සකස් කර ඇත්තේ, ණය කළඹේ අවදානම් දරා ගැනීම සහ පිරිවැය අරමුණු මත පදනම්වයි. මෙමගින් දේශීය ණය වෙළඳපොළ පුළුල් කිරීම සහ විදේශ මූල්‍ය වෙළඳපොළ වෙත නැවත පිවිසීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග ඇතුළත් වන අතර, එය රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ඉලක්ක සමඟ සංගතතාව තහවුරු කරමින් මධ්‍යකාලීන සාර්ව ආර්ථික පුරෝකථන සමඟ ගලපා ඇත.

7.1 2031 වසර අවසානය වන විට ණය කළමනාකරණ ඉලක්ක

වගුව 06: 2031 වසර අවසානය වන විට ණය කළමනාකරණ ඉලක්ක

පිරිවැය සහ අවදානම් දර්ශක	මට්ටම(2025 අවසාන)	ඉලක්කගත මට්ටම (2030 අවසාන)	පවතින මට්ටම(2026 අවසාන)	ඉලක්කගත මට්ටම (2031 අවසාන)	විචලනය
සාමාන්‍ය පරිණත වීමේ කාලය					
දේශීය ණය කළඹ	වර්ෂ 4.6	වර්ෂ 6	වර්ෂ 4.7	වර්ෂ 6	1+/-
මුළු ණය කළඹ	වර්ෂ 6.8	වර්ෂ 8	වර්ෂ 6.6	වර්ෂ 8	
මුළු ණයට සාපේක්ෂව භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිශතය	10.1%	5%	6.6%	3.5%	1+/-
වසරක් ඇතුළත නැවත ප්‍රතිස්ථාපනය වන මුළු ණය ප්‍රමාණය - මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස	26.8%	22%	24.1%	20%	1+/-
වසරක් ඇතුළත කල්පිරෙන ණය - දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	17%	10%	12.4%	9%	2+/-
ආදායමට සාපේක්ෂව පොලී ගෙවීම් - ප්‍රතිශතයක් ලෙස	52.2%	35%	44. %	34%	5+/-
මුළු ණය සංචිතයෙන් විදේශ විනිමය ණය ප්‍රතිශතය	37.8%	-	41.0%	30%	2+/-

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

ඒ අනුව, පිරිවැය සහ අවදානම අතර ප්‍රශස්ත හුවමාරුවක් (Optimal Trade-Off) සහතික කිරීම පිණිස විවිධ ණය ගැනීමේ සංයුතීන්ගෙන් යුත් විකල්ප මූල්‍යකරණ උපායමාර්ග හතරක් පරීක්ෂාවට ලක් කරන ලදී. මෙම උපායමාර්ග මඟින් එක් එක් විභව මූල්‍යකරණ මූලාශ්‍රයන්, ලබා ගැනීමට ඇති හැකියාව, එම මූලාශ්‍රයන්ගේ පිරිවැය සහ අවදානම පිළිබඳව අවධානය යොමු කෙරිණි. දේශීය ණය කළඹ තුළ භාණ්ඩාගාර බිල්පත් කෙරෙහි පවතින ඉහළ යැපීම, දේශීය ණයවල කෙටි පරිණත වීමේ පරාසය, දිගුකාලීන කල්පිරීම් සහිත ජාත්‍යන්තර මූල්‍ය

ආයතනවලින් විදේශ මූල්‍යකරණය ලබා ගැනීමේ හැකියාව, නැවත ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ විභවය සහ විදේශ විනිමයෙන් නාමනය කරන ලද දේශීය ණය සුරැකුම්පත් නිකුත් කිරීමට ඇති කැමැත්ත මෙහිදී සැලකිල්ලට ගත් ප්‍රධාන සාධක අතර විය. මෙම කරුණු 2027–2031 කාලසීමාව සඳහා ප්‍රශස්ත මූල්‍යකරණ උපායමාර්ගය තෝරාගැනීමට මඟපෙන්වන ලදී.

7.2 මූල්‍යකරණ උපායමාර්ගය 2027-2031

මූල්‍යකරණ උපායමාර්ගය 2027–2031 මඟින් වගුව 06 හි දක්වා ඇති ණය කළමනාකරණ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගනිමින්, මධ්‍ය කාලීනව ණය ගැනීම් සඳහා වන උපායමාර්ගික මාර්ගෝපදේශ සපයනු ලැබේ. එහි ප්‍රධාන උපායමාර්ගික දිශානතීන් පහත පරිදි වේ:

අ. ණය ගැනීමේ සංයුතිය: 2027-2028 කාලපරිච්ඡේදයේදී ණය ගැනීමේ සංයුතිය ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කළ ණය උපකරණවලින් සියයට 88 ක් සහ විදේශ විනිමයෙන් නාමනය කළ ණය උපකරණවලින් සියයට 12 ක් ලෙස පවත්වා ගැනීම. ඉන්පසුව, වෙළඳපොළ තත්ත්වයන්, ආයෝජකයන්ගේ කැමැත්ත සහ හැසිරීම සලකා බලමින්, කල්පිරෙන විදේශ විනිමය ණය නැවත ගෙවීම සඳහා අවශ්‍ය විදේශ විනිමය ද්‍රවශීලතා අවශ්‍යතාව තහවුරු කිරීමට උපායමාර්ගිකව සූදානම් වීම සඳහා විදේශ විනිමයෙන් නාමනය කළ ණය උපකරණවලින් ණය ගැනීමේ සංයුතිය සියයට 15 දක්වා වෙනස් කරනු ඇත.

ආ. විදේශ විනිමය මූල්‍යකරණ උපායමාර්ගය: ශ්‍රී ලංකාව ලෝක බැංකුව විසින් ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස ඉහළ නංවා ඇති බැවින්, විදේශීය ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික නියෝජිතායතනවලින් සහනදායී මූල්‍යයනයන් ලැබීමේ හැකියාව සීමා වනු ඇත. කෙසේ වෙතත්, වසර 5 කට වැඩි සහන කාලයක් සහිතව වසර 20 කට වැඩි දිගු කාලීන කල්පිරීම් සහිත ප්‍රතිපත්ති පදනම් කරගත් හෝ වැඩසටහන් පදනම් කරගත් මූල්‍යයනයන් සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්හි පවතින අවස්ථාවන් පිළිබඳව ශ්‍රී ලංකාව සොයාබැලීම් කරනු ඇත.

රටේ ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගනිමින් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික නියෝජිතායතන සමඟ වාසිදායක මූලාශ්‍ර යටතේ ව්‍යාපෘති මූල්‍යයනය අඛණ්ඩව කරගෙන යාමට ශ්‍රී ලංකාව තවදුරටත් කැපවී සිටී.

එයට අමතරව, විදේශ විනිමය ද්‍රවශීලතාව සහිත දේශීය ආයෝජකයන් රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත ආකර්ෂණය කර ගැනීමට සහ ආයෝජක පදනම විවිධාංගීකරණය කිරීම තවදුරටත් ශක්තිමත් කරනු ඇත. දේශීය වෙළඳපොළ තුළ විදේශ විනිමයෙන් නාමනය කළ බැඳුම්කර සීමිත ලෙස නිකුත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

ඇ. දේශීය විනිමය මූල්‍යකරණ උපායමාර්ගය : දේශීය වශයෙන්, මූල්‍යකරණ උපායමාර්ගය සම්පූර්ණයෙන්ම වෙළඳපොළ පදනම් කරගත් මූල්‍යකරණ උපකරණ, එනම් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර කෙරෙහි අවධානය යොමු කර ඇත. භාණ්ඩාගාර බිල්පත් මත පවතින බැදියාව ක්‍රමයෙන් අඩු කිරීම මඟින් ප්‍රතිමූල්‍යකරණ අවදානම කළමනාකරණය කිරීම උපාය මාර්ගය මඟින් අරමුණු කෙරේ. සාමාන්‍ය කල්පිරීමේ කාලය දීර්ඝ කිරීමට සහ ණය නැවත පියවීමේ පැතිකඩ සුමට කිරීමට, වසර 3, 5, 8, 10, 12 සහ 15 යන කල්පිරීම් සහිත ස්ථාවර අනුපාතික භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට සැලසුම් කෙරේ.

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගික විශ්ලේෂණ මෙවලම අනුව, ඉහත උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ පදනම මත 2031 වසර අවසාන වන විට පිරිවැය අවදානම් දර්ශකවල අපේක්ෂිත මට්ටම වගුව 07 හි නිරූපණය කෙරේ.

වගුව 07: පිරිවැය සහ අවදානම් දර්ශක - මූලික තත්වයන් යටතේ

අවදානම් දර්ශක		2026 (වත්මන්)	2031 අවසාන වන විට
නාමික ණය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)		89.0	78.1
ණය වර්තමාන අගය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)		87.1	76.6
පොලී ගෙවීම් (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)		7.4	6.3
පොලී ගෙවීම් (ආදායමේ ප්‍රතිශතයක් ලෙස)		44.6	40.0
අනුමානිත පොලී අනුපාතය (ප්‍රතිශතයක් ලෙස)		8.2	8.7
ප්‍රතිමූල්‍යකරණ අවදානම	වසරක් ඇතුළත කල්පිරෙන ණය ප්‍රමාණය (මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස)	12.8	12.4
	වසරක් ඇතුළත කල්පිරෙන ණය ප්‍රමාණය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)	12.4	9.7
	විදේශ ණය කළඹේ සාමාන්‍ය පරිණත කාලය - වසර	8.9	8.1
	දේශීය ණය කළඹේ සාමාන්‍ය පරිණත කාලය වසර	4.7	4.7
	මුළු ණය කළඹේ සාමාන්‍ය පරිණත කාලය වසර	6.6	6.0
පොලී අනුපාතික අවදානම	ප්‍රතිස්ථාවර වීමේ සාමාන්‍ය කාලය - වසර	5.7	4.9
	වසරක් ඇතුළත ප්‍රතිස්ථාපනය වන ණය ප්‍රමාණය (මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස)	24.1	23.3
	භාණ්ඩාගාර බිල්පත් ඇතුළත්ව ස්ථාවර අනුපාතික ණය ප්‍රමාණය (මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස)	88.1	88.3
	භාණ්ඩාගාර බිල්පත් (මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස)	6.6	3.8
විදේශ විනිමය අවදානම	විදේශ විනිමය ණය ප්‍රමාණය (මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස)	41.0	35.8
	කෙටිකාලීන විදේශ විනිමය ණය ප්‍රමාණය (සංචිතවලින් ප්‍රතිශතයක් ලෙස)	19.7	5.9

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකු මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය විශ්ලේෂණ මෙවලමෙන් ව්‍යුත්පන්න කරන ලදී.

මධ්‍යකාලීන මූල්‍යකරණ උපායමාර්ගයට සමගාමීව වගුව 06 හි අර්ථ දක්වා ඇති ණය කළමනාකරණ ඉලක්ක සපුරා ගැනීම සඳහා, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පහත සඳහන් ණය කළමනාකරණ උපායමාර්ග මධ්‍යකාලීනව ක්‍රියාත්මක කරනු ඇත.

I **රජයේ දේශීය බැඳුම්කර වෙළඳපොළ සංවර්ධනය කිරීම:** ආයෝජක පදනම පුළුල් කිරීම සහ රජයේ ණය සුරැකුම්පත් සඳහා දේශීය වෙළඳපොළ සංවර්ධනය කිරීම ගවේශණය කිරීම මඟින් රජයේ දේශීය බැඳුම්කර වෙළඳපොළ සංවර්ධනය කිරීම. ප්‍රාථමික අලෙවිකරුවන්ගේ පද්ධතිය සහ දේශීය ණය වෙළඳපොළ පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කරනු ලබන අතර, ඒ අනුව ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

II **ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වෙළඳපොළට යළි ප්‍රවේශ වීම සඳහා වන ගමන් මඟ සැලසුම් කිරීම** - ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ අලුතින් නිකුත් කරන ලද ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්වලින් නාමනය කරන ලද, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල කල්පිරීමේ ව්‍යුහය අනුව 2028 වසරේ සිට සැලකිය යුතු ප්‍රමාණයක් පියවීමට ඇතිබව පෙන්නුම් කරයි. ඒ අනුව, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වෙළඳපොළට යළි ප්‍රවේශ වීම සඳහා පූර්ව සූදානම් වීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ. ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම සහ හිතකර ණය ශ්‍රේණිගත කිරීම ප්‍රධාන පූර්ව අවශ්‍යතා ලෙස පවතින අතරම, ආයෝජක සබඳතා වැඩිදියුණු කිරීම සහ ණය විනිවිදභාවය වැඩිදියුණු කිරීම ද ඒ හා සමානව තීරණාත්මක වනු ඇත. ශ්‍රී ලංකාවේ ණය උපකරණවල ආයෝජනය කිරීමට ආයෝජකයන්ගේ විශ්වාසය සහ අභිරුචිය ඉහළ නැංවීම සඳහා ගනුදෙනු-නොවන ප්‍රවාරක චාරිකා (non-deal road shows) පැවැත්වීමට මූලික පියවර ගනු ලැබේ. ප්‍රතිමූල්‍යකරණ ක්‍රියාවලියේ සුමටව සිදු කිරීම තහවුරු කර ගැනීම සඳහා මෙම පූර්ව ක්‍රියාමාර්ග ක්‍රියාකාරී ලෙස සිදු කරනු ඇත.

III **ආණ්ඩුවේ වත්මන් ණය කළඹේ ව්‍යුහය සහ අවදානම් පැතිකඩ ක්‍රියාශීලීව කළමනාකරණය**

කිරීම (වගකීම් කළමනාකරණ මෙහෙයුම් (Liability Management Operations) ක්‍රියාත්මක කිරීම මඟින්) - වත්මන් ණය කළඹේ ප්‍රති මූල්‍යකරණ අවදානම කළමනාකරණය කිරීම, දේශීය ණය වෙළඳපොළ සංවර්ධනය කිරීම සහ ණය සේවාකරණ පිරිවැය හැකි පරිදි අවම කිරීමේ ප්‍රධාන අරමුණ ඇතිව වගකීම් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් දේශීය ණය කළඹේ සාමාන්‍ය පරිණත වීමේ කාලය දීර්ඝ කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

මීට අමතරව, ණය කළඹේ නැවත මූල්‍යකරණ අවදානම, විදේශ විනිමය අවදානම සහ පොලී අනුපාතික අවදානම අඩු කිරීමේ මූලික අරමුණ ඇතිව, විදේශ ණය කළඹ සම්බන්ධයෙන් ණය ආපසු මිලදී ගැනීම් (Buy backs), හුවමාරු කිරීම් (Switches) මෙන්ම ව්‍යවහාර මුදල් සහ පොලී අනුපාතික පරිවර්තනයන් වැනි වගකීම් කළමනාකරණ මෙහෙයුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ. ආණ්ඩුවේ ණය කළඹේ අවදානම් දරාගැනීම් මට්ටම විශ්ලේෂණය කරමින් අවදානම් ආවරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම පිලිබඳව ද සලකා බලනු ඇත.

IV ආපදා අවදානම් මූල්‍යකරණ උපායමාර්ගයක් (Disaster Risk Financing Strategy) සකස් කිරීමේ හැකියාවන් සොයා බැලීම - ස්වභාවික ආපදාවන්ට මුහුණ දීම සඳහා රජයේ මූල්‍ය සූදානම සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් ආපදා ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කිරීම. මීට අමතරව, ආපදා අවදානම් කළමනාකරණය සඳහා රජය සතු මූල්‍යකරණ මෙවලම් පරාසය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් හදිසි අවස්ථාවලදී ක්‍රියාත්මක කළ හැකි මූල්‍ය පහසුකම් උපයෝගි කරගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාමාර්ග මඟින් ආපදාවක් ඇති වූ අවස්ථාවකදී කඩිනමින් මූල්‍ය සම්පත් සලසා ගැනීමට රජයට ඇති හැකියාව වැඩිදියුණු කිරීම, රාජ්‍ය මූල්‍ය කම්පනය අවම කිරීම සහ සමස්ථ රාජ්‍ය මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

V රාජ්‍ය ණය ප්‍රකාශන විෂයපථය සහ සහභාගීත්ව උපායමාර්ගය ප්‍රශස්තකරණය සහ පුළුල් කිරීම තුළින් ණය කළමනාකරණයේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරු කිරීම: එක් එක් මූල්‍ය වසර අවසන් වී දින 180 ක් ඇතුළත වාර්ෂික වාර්තාව නිකුත් කිරීම මෙයට ඇතුළත් වන අතර එමඟින් රාජ්‍ය ණය කළමනාකරණය පිලිබඳ පුළුල් හා සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කෙරේ. මීට අමතරව, කාර්තුමය සංඛ්‍යාත්මක ණය ප්‍රකාශය සහ අර්ධ වාර්ෂික ණය දත්ත වාර්තාව වැනි පවත්නා ප්‍රකාශනවල ගුණාත්මකභාවය සහ ආවරණය තව දුරටත් වැඩිදියුණු කරනු ලබන අතර, එමඟින් පාර්ශවකරුවන්ට වඩාත් විස්තරාත්මක සහ කාලෝචිත තොරතුරු ලබාගැනීමේ හැකියාව තහවුරු කෙරේ.

මධ්‍යගත තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට සැලසීම, පරිශීලකයන්ගේ තොරතුරු ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ මහජනතාව හා වෙළඳපොළ සහභාගිවන්නන් සමඟ වඩාත් අන්තර්ක්‍රියාකාරී සන්නිවේදනයක් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සඳහාම වෙන් වූ වෙබ් අඩවියක් ද ස්ථාපිත කිරීම මඟින් සන්නිවේදන මාධ්‍ය තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. තවද, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මඟින් ඉදිරි වසර සඳහා වන රජයේ මූල්‍යකරණ උපායමාර්ගය ගෙනහැර දක්වනු ඇත. මෙම සැලැස්ම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 හි මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කරනු ලබන අතර, එමඟින් රජයේ ණය ගැනීමේ ප්‍රවේශය දිගුකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වන බව තහවුරු කෙරේ. දේශීය ණය සුරැකුම්පත් වෙන්දේසි දින දර්ශනය, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සමඟ අනුකූලව සකස් කර, එය අඛණ්ඩව යාවත්කාලීන වන චක්‍රීය කාර්තුමය පදනමින් ප්‍රකාශයට පත් කරනු ඇත. යම් නිශ්චිත ණය නිකුත් කිරීමකට පෙර මාස තුනක පූර්ව දැනුම්දීමක් ලබා දෙමින්, වෙළඳපොළ නිරන්තරයෙන් යාවත්කාලීන වන බව මෙමඟින් තහවුරු කරනු ඇත.

VI ද්‍රවශීලතා කළමනාකරණය, මූල්‍යකරණ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සහ

ප්‍රතිමූල්‍යකරණ පොලී අනුපාතික අවදානම අවම කිරීම සඳහා මුදල් සංචිත උපායමාර්ගිකව භාවිත කිරීම: අලුතින් ණය ලබා ගැනීමකින් තොරව හෝ ඉහළ පොලී අනුපාත යටතේ ණය වක්‍රීයකරණයකින් තොරව, භාණ්ඩාගාර බිල්පත් හෝ කෙටිකාලීන බැඳුම්කර වැනි කල්පිරෙන ණය උපකරණ නැවත ගෙවීම සඳහා මුදල් සංචිතය විවක්ෂණශීලීව යොදවා ගනු ඇත. ණය සේවාකරණ බැඳීම් (ද්‍රවශීලතා අවදානම), ආදායම්වල හෝ වෙළඳපොළ ප්‍රවේශයේ ඇති වන අස්ථාවරත්වය (කම්පන අවශෝෂණය) සහ හදිසි අවස්ථා සඳහා වන අනපේක්ෂිත වියදම් යන කරුණු සැලකිල්ලට ගනිමින්, කෙටිකාලීන මූල්‍ය වගකීම් පියවීමට ප්‍රමාණවත් මුදල් සංචිතයක් පවත්වාගෙන යන අතරම අනවශ්‍ය ලෙස අතිරික්ත මුදල් අක්‍රීයව රඳවා තැබීම වලක්වාගැනීමේ අරමුණු ඇතිව මුදල් ආරක්ෂිත සංචිතයේ ප්‍රශස්ත මට්ටම තීරණය කරනු ඇත. පොලී අනුපාතික සහ ප්‍රතිමූල්‍යකරණ අවදානම් අවම කිරීම සඳහා, මුදල් ආරක්ෂිත සංචිතය විධිමත් හා ව්‍යුහගත ක්‍රමවේදයක් යටතේ උපයෝගී කරගැනීම නියාමනය කිරීමට අදාළ බලධාරීන් වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය කටයුතු කරනු ඇත.

7.3 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 ක්‍රියාත්මක කරනු ඇත. රජයේ ණය ගැනීමේ උපාය මාර්ගයේ මෙහෙයුම් රාමුව ලෙස ක්‍රියා කරන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2027 මඟින් මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සවිස්තරාත්මක ව ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම දක්වා ඇත.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2027 සකස් කිරීමේදී, එය මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 සමඟ ගැලපීම සහතික කිරීම සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ සමීප ව කටයුතු කරනු ඇත. මෙම සහයෝගී ප්‍රවේශය සමස්ත රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්තිය සමඟ ණය කළමනාකරණ මෙහෙයුම්වල සහජීවනය වැඩි දියුණු කරන අතර, හොඳින් ඒකාබද්ධ වූ ප්‍රවේශයක් ඇති කරනු ලබයි.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයෙහි ප්‍රගතිය සහ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය නීසි කාලීන සමාලෝචනයන් පවත්වනු ඇත. මෙම සමාලෝචන රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන අතර විනිවිදභාවයෙන් යුතු අධීක්ෂණය සහ ජාතික ණය කළමනාකරණ අරමුණු සමඟ අඛණ්ඩ පෙළගැස්ම සහතික කෙරේ. සැලසුම් කළ උපාය මාර්ගයෙන් බැහැරවීම් හඳුනාගත හොත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් එම අභියෝගවලට පිළියම් යෙදීමටත්, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයෙහි ඉලක්ක කාලෝචිත හා කාර්යක්ෂම ආකාරයකින් සපුරා ඇති බව සහතික කිරීමට පූර්ව ක්‍රියාකාරී නිවැරදි කිරීමේ පියවර ගනු ඇත.

7.4 සීමාවන් සහ අභියෝග

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027–2031 සකස් කිරීම මඟින් මධ්‍යකාලීනව ආණ්ඩුවේ ණය කළමනාකරණය මෙහෙයවීම සඳහා ශක්තිමත් රාමුවක් සපයනු ලැබුව ද, නියමිත ඉලක්ක සපුරා ගැනීමට සහ උපායමාර්ගය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ දී විවිධ වූ සීමාවන්ට හා අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 ප්‍රධාන සීමාවන් සහ අභියෝගයන් වන්නේ:

I 1985 වසරේ සිට ණය දත්ත වාර්තාකරණය සඳහා භාවිතා කරන ලද CSDRMS පද්ධතියෙන් **නව පද්ධතියක් වන** පොදුරාජ්‍ය මණ්ඩලීය මෙරිඩියන් ණය කළමනාකරණ පද්ධතිය (Commonwealth Meridian Debt Management System) වෙත ණය දත්ත සංක්‍රමණය වීමේ ක්‍රියාවලිය හේතුවෙන්,

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 සකස් කිරීම සඳහා අවශ්‍ය ණය දත්ත ඒකාබද්ධ කිරීම අභියෝගාත්මක විය.

II. විදේශ විනිමය අනුපාතිකයේ පවතින විචල්‍යන් සහ පොලී අනුපාතික උච්චාවචනයන් මඟින් විදේශ ණය කළඹ ආශ්‍රිතව අමතර අවදානම් ඇති වන අතර, ඒවා සම්පූර්ණයෙන් ආවරණය කිරීම හෝ පුරෝකථනය කිරීම දුෂ්කර විය හැකිය.

III. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 සකස් කිරීමේදී භාවිත කරන ලද මූලික සාර්ව ආර්ථික පුරෝකථන සහ උපකල්පන කාලයත් සමඟ වෙනස් විය හැකිය. ආර්ථික වර්ධනය, උද්ධමනය, රාජ්‍ය මූල්‍ය තිහය, පොලී අනුපාතික සහ විදේශ විනිමය අනුපාතික පිළිබඳ පවතින අවිනිශ්චිතතාවයන්, සත්‍ය ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

IV. දේශීය ණය වෙළඳපොළ තවදුරටත් සංවර්ධනය වීමට නියමිත බැවින්, සීමිත ආයෝජක විවිධාංගීකරණය සහ කෙටි කල්පිරීමේ කාලයන් සහිතව දේශීය වෙළඳපොළ තවදුරට පුළුල් නොවූ මට්ටමක පැවතීමෙන් ණය ඵලදායී වක්‍රය දීර්ඝ කිරීමකට හෝ කල්පිරෙන ණය අඩු පිරිවැයකින් ප්‍රතිමූල්‍යකරණය කිරීමකට රජයට ඇති හැකියාව සීමා වේ. විදේශ මූල්‍යකරණ විකල්ප, සහනදායී මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාවත් ජාත්‍යන්තර වෙළඳපොළ තත්වය මත රදා පවතින අතර එමගින් විදේශීය ණය ගැනීමේ වරණයන්හි පවතින නම්‍යශීලීභාවය සීමා විය හැකි ය.

8. නිගමනය

2025 වසර සහ 2026 වසර අවසානයේ දර්ශක සංසන්දනය කිරීමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය අවදානම් පැතිකඩෙහි බහුතරයක් දර්ශකයන්හි වර්ධනයක් සිදුව ඇති බවයි. විශේෂයෙන්ම, භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයන් අඩුවීම, වසරක් ඇතුළත ප්‍රතිමූල්‍යකරණයට හෝ පොලී අනුපාත නැවත සකස් කිරීමට යටත් වන ණය ප්‍රමාණය අඩු වීම, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව වසරක් ඇතුළත කල්පිරෙන ණය ප්‍රමාණය අඩු වීම සහ ආදායමට සාපේක්ෂව පොලී ගෙවීම් අඩු වීම යනාදිය මඟින් කෙටිකාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානම් කළමනාකරණය කිරීමේ සහ ණය දැරිය හැකි මට්ටම වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය පෙන්නුම් කරයි.

විදේශ මුදල් ණය ප්‍රමාණයේ කොටස වැඩි වීම හා සමස්ථ ණය කළඹේ සාමාන්‍ය කල් පිරීමේ කාලයේ සුළු අඩුවීමක් දක්නට ලැබුණද සමස්ත ණය අවදානම් පැතිකඩෙහි සැලකිය යුතු වැඩි දියුණුවක් අත් කරගෙන ඇත. තවද , 2025 වසර අවසානය හා සැසඳීමේදී 2026 වසර අවසානයේ ණය දර්ශක වල දක්නට ලැබෙන දියුණුව අඛණ්ඩව ක්‍රියාත්මක වන ණය කළමනාකරණ ප්‍රයත්න වල ධනාත්මක බලපෑම පිළිඹිබු කරයි. ණය තිරසරභාවය තව දුරටත් ශක්තිමත් කිරීම සහ ණය කළඹෙහි ඔරොත්තු දීම වැඩි දියුණු කිරීම සඳහා මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027–2031 මඟින් ශ්‍රී ලංකා රජයේ ණය කළමනාකරණය සඳහා වන ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් නිරූපණය කරයි. ප්‍රතිමූල්‍යකරණ අවදානම මෙන්ම පොලී අනුපාතික අවදානම සහ විනිමය අනුපාත අවදානම වැනි අවදානම්වලට නිරාවරණය වීම අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම උපායමාර්ගය ණය ගැනීමේ පිරිවැය අඩු කරන අතරම දිගුකාලීන ණය තිරසරත්වය ළඟා කර ගැනීම අරමුණු කරයි. කාලයත් සමඟ කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් මත යැපීම සැලසුම් සහගත ලෙස අඩු කරමින්, දේශීය වෙළඳපොළ පදනම් කරගත් මූල්‍යකරණය කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම මෙම උපායමාර්ගයේ ප්‍රධාන අංගයකි.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 මඟින් කෙටිකාලීන ණය අඩු කිරීම, ණය

කල්පිරීමේ කාලයන් දීර්ඝ කිරීම සහ ආදායමට සාපේක්ෂව පොලී ගෙවීම් අනුපාතය පහත හෙළීම මඟින් ණය තිරසරත්වය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන අතර, එමඟින් රාජ්‍ය මූල්‍ය නම්‍යශීලීභාවය ඉහළ නංවන අතර ණය සේවාකරණ බර අඩු කරනු ඇත.

ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවය විය යුත්තේ කෙටිකාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානම් අඩු කිරීමේ ප්‍රගතිය තහවුරු කරගන්නා අතරම, සමස්ත කල්පිරීමේ පැතිකඩ වැඩිදියුණු කිරීම, විදේශ විනිමය අවදානමට නිරාවරණය වීම අඩු කිරීම සහ සමස්ත ණය දරාගැනීමේ හැකියාව ශක්තිමත් කිරීමෙහි ඒකාබද්ධ ප්‍රගතියක් අත්කර ගැනීමය. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා විචක්ෂණශීලී ණය ගැනීමේ තීරණ, නිසි නිකුත් කිරීම් සැලසුම්කරණය, සළුලදායී වගකීම් කළමනාකරණය සහ ණය කළඹේ පිරිවැය සහ අවදානම් ලක්ෂණ පිළිබඳ නිරන්තර පරීක්ෂාව මඟින් මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමක් අවශ්‍ය වේ.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027–2031 මඟින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ණය කළමනාකරණය සඳහා ශක්තිමත් රාමුවක් සපයන අතර, දේශීය මෙන්ම ගෝලීය ආර්ථික අභියෝග හමුවේ රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කරයි. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2027-2031 සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් ආණ්ඩුවේ ණය කළඹ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමටත්, ශ්‍රී ලංකාවේ ණය තිරසරත්වය තහවුරු කිරීමටත් සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇත.

PDMO

ශ්‍රී ලංකා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය | ශ්‍රී ලංකාව

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම

ශ්‍රී ලංකාවේ තනි වසරක මූල්‍යකරණ උපායමාර්ගය

2027

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ලේකම් කාර්යාලය (3 වන මහල)
කොළඹ 00100
ශ්‍රී ලංකාව
info@pdmo.gov.lk

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම-2027

පටුන

1. හැඳින්වීම 1
2. ණය ගැනීමේ අවශ්‍යතාවය 2
3. ණය ගැනීමේ සංයුතිය 3
4. යෝජිත ණය ගැනීමේ සංයුතිය 4
5. අධීක්ෂණය සහ වාර්තා කිරීම 4
6. නිගමනය 4

1. හැඳින්වීම

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම සඳහා වන නෛතික අවශ්‍යතාවය

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සකස් කිරීම සඳහා වන නෛතික පදනම 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති අතර, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයට අනුකූල වන පරිදි කල යුතු බවට එමඟින් නියම කර ඇත. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 15 වැනි වගන්තියට ප්‍රකාරව,එම වර්ෂය සඳහා වන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් විසර්ජන පනතට අනුකූලව ශ්‍රී ලංකා රජයේ සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා සෑම මුදල් වර්ෂයක් සඳහාම වාර්ෂික ණය ගැනීමේ සැලැස්මක් සකස් කළ යුතුව ඇත.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ඉදිරි වසර වෙනුවෙන් වාර්ෂික ණය ගැනීමේ සැලැස්මක් හරහා පැහැදිලි සහ ක්‍රියාවට නැංවිය හැකි සැලැස්මක් සකස් කිරීම මූලික අවශ්‍යතාවයකි. වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම යනු අදාළ මූල්‍ය වසර සඳහා රජයේ දළ මූල්‍යන අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද තනි අවුරුදු මූල්‍යකරණ උපායමාර්ගයකි. ණය කළමනාකරණයේ ප්‍රාථමික අරමුණ වන විවක්ෂණශීලී අවදානම් මට්ටමකට යටත්ව, ණය සේවාකරණ බැඳීම් ඇතුළුව ආණ්ඩුවේ මූල්‍යකරණ අවශ්‍යතා කාලෝචිත ලෙස සහ අවම වියදමකින් ඉටු කර ගැනීම තහවුරු කිරීම සඳහා මෙම වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම උපකාරී වේ. රාජ්‍ය ආදායම්, වියදම් සහ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ පුරෝකථනයන් සැලකිල්ලට ගනිමින්, ඉදිරි වසර සඳහා වන දළ මූල්‍යකරණ අවශ්‍යතා සපුරා ගැනීමේ මූල්‍යකරණ උපායමාර්ගය වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මගින් ගෙන හැර දක්වයි. ඒ අනුව, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මගින් මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයේ පළමු වසරේ ක්‍රියාත්මක කිරීම සක්‍රීයව මෙහෙයවනු ලබයි.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම, රජයේ ණය ගැනීමේ රාමුවේ මූලික අංගයකි. එමඟින් අදාළ මූල්‍ය වසර සඳහා රජයේ දේශීය හා විදේශ ණය ගැනීම් මෙහෙය වන අරමුණු, ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ දක්වා ඇත.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම රජයේ මූල්‍යකරණ උපායමාර්ගයට (2027-2031) අනුකූල වන අතර, ණය ගැනීමේ පිරිවැය අවම කර ගැනීම සහ ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු

කරමින් 2027 වසර සඳහා වන යෝජිත ණය ගැනීමේ සංයුතිය ඉදිරිපත් කරයි. වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම - 2027 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය (2027–2031) සමඟ පූර්ණ වශයෙන් අනුකූල වේ.

රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධානයන්ට අනුකූලව, භාවිතා කිරීමට නියමිත තාවකාලික උපකරණ, ණය ගැනීමේ මූලාශ්‍ර, අන්තර්-වර්ෂ කල්පිරීම් ඇතුළුව වසර තුළ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සහ ණය ගැනීමේ දර්ශක කාලරාමුව ඇතුළත් 2027 වාර්ෂික ණය ගැනීමේ සැලැස්මේ සවිස්තරාත්මක අනුවාදයක් ප්‍රකාශයට පත් කරනු ඇත.

2. ණය ගැනීමේ අවශ්‍යතාවය

2027 වසර සඳහා රජයේ සමස්ත ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 9,930 ක් වන අතර, එය බදු සහ බදු නොවන ආදායම්, ප්‍රදාන සහ ණය මගින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරයි. ආදායම් සහ ප්‍රදාන රුපියල් බිලියන 6,230 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, අනෙකුත් ගිණුම්කරණ ගැලපීම් ද සහිතව රුපියල් බිලියන 3,800 ක මූල්‍ය හිඟයක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම මූල්‍ය හිඟය පියවාගැනීම සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 730 ක සහ රුපියල් බිලියන 3,070 ක විදේශ හා දේශීය ණය ගැනීම් මගින් මූල්‍යනය කරනු ඇත. (01 වගුව).

01 වගුව: දළ මූල්‍ය අවශ්‍යතා - 2027

		2027 ඇස්තමේන්තුව (රුපියල් බිලියන)
ප්‍රාථමික වියදම්		**5,070**
පුනරාවර්තන වියදම්	3,320	
ප්‍රාග්ධන වියදම්	1,750	
රජයේ ණය සේවාකරණය		**4,850**
පොලී ගෙවීම්	2,643	
ණය ආපසු ගෙවීම්*	2,207	
අත්තිකාරම් ගිණුම් මෙහෙයුම් සඳහා ප්‍රතිපාදන		**10**
සමස්ත වියදම		**9,930**
සමස්ත ආදායම		**6,230**
රජයේ සුරැකුම්පත් සඳහා පොත් / මුදල් අගය ගැලපීම		**100**
ණය ගැනීමේ සීමාව **		**3,800**
දේශීය මූල්‍යනය	3,070	
විදේශ මූල්‍යනය	730	

* 2027 විසර්ජන කෙටුම්පතේ 2(ආ) වගන්තියට අනුව, 2027 මුදල් ප්‍රමාණය 2027 මුදල් වසර තුළ ලබාගත් සමස්ත කෙටි කාලීන ණය ගැනීම් සහ 2027 මුදල් වසර තුළ සිදු කරන ලද සමස්ත කෙටි කාලීන ණය පියවීම් අතර වෙනස පමණක්, 2027 මුදල් වසර තුළ සිදු කරන ලද ණය ගැනීම් ගණනය කිරීමේ අරමුණ සඳහා කෙටි කාලීන ණය ගැනීමේ ප්‍රමාණය තීරණය කිරීමේදී සලකා බලනු ලැබේ. ඒ අනුව, ණය ආපසු ගෙවීම සඳහා අවශ්‍ය මුදලට භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් ඇතුළත් කර නොමැත.

** 2027 වසර තුළ කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් හැර. ඇස්තමේන්තුවට අනුව, 2027 වසර තුළ කල්පිරෙන රුපියල් බිලියන 2,300 ක භාණ්ඩාගාර බිල්පත් ඇති අතර, එය ණය ගැනීමේ සංයුතිය තීරණය කිරීමේදී සලකා බලා ඇත. 2027 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතේ 2 (b) වගන්තියට අනුව, 2027 වර්ෂය තුළ කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් හැර, එම වර්ෂය සඳහා වන ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,800ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

රුපියල් බිලියන 640 ක ඇස්තමේන්තුගත දළ විදේශ ණය ගැනීම්, දැනටමත් ගිවිසුම්ගත වී ඇති ණය යටතේ අපේක්ෂිත ප්‍රතිලබ්ධි සහ බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ණය දෙන ආයතනවලින් ලබාගැනීමට අපේක්ෂිත නව ණයවලට අදාළ වන අතර, රුපියල් බිලියන 3,160 ක දේශීය ණය ගැනීම්, දේශීය වෙළඳපොළෙන් අලුතින් ලබාගැනීමට නියමිත නව ණය ප්‍රමාණයට අදාළ වේ.

වගුව 01 අනුව, 2027 සඳහා රජයේ සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාව රුපියල් බිලියන 3,800 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එම වසර තුළ කල්පිරීමට නියමිත යැයි ඇස්තමේන්තු කර ඇති රුපියල් බිලියන 2,300 ක භාණ්ඩාගාර බිල්පත් (අන්තර්-වර්ෂ කල්පිරීම් රහිතව) ප්‍රමාණය ඊට ඇතුළත් කර නොමැත. ඒ අනුව කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මූල්‍යකරණය කිරීම ද ඇතුළත්ව (අන්තර්-වර්ෂ කල්පිරීම් නොමැතිව), 2027 සඳහා සමස්ත මූල්‍යයන අවශ්‍යතාව රුපියල් බිලියන 6,100 ක් ලෙස පුරෝකථනය කර ඇත.


ප්‍රධාන සංඛ්‍යා ලේඛන

- **රුපියල් බිලියන 3,800** — 2027 විසර්ජන කෙටුම්පතට අනුව 2027 වසර සඳහා වන ණය ගැනීමේ අවශ්‍යතාවය (කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් හැර)
- **රුපියල් බිලියන 2,300** — 2027 වසර තුළ කල්පිරෙන භාණ්ඩාගාර බිල්ප
- **රුපියල් බිලියන 6,100** — භාණ්ඩාගාර බිල්ප නැවත මූල්‍යකරණය කිරීම ද ඇතුළත්ව සමස්ත මූල්‍යකරණ අවශ්‍යතාවය (අන්තර් වර්ෂ කල්පිරීම් රහිතව)

3. ණය ගැනීමේ සංයුතිය

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගට-2027–2031 අනුකූලව, රජය සිය සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාවයෙන් සියයට 88 ක් ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද දේශීය ණය උපකරණ හරහා ලබා ගැනීමටත්, ඉතිරි සියයට 12 විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණය උපකරණ මගින් මූල්‍යනය කිරීමටත් සැලසුම් කර ඇත. ඒ අනුව, රුපියල් බිලියන 730 ක් විදේශ ව්‍යාපාර මුදලින් නාමනය කරන ලද ණය උපකරණ හරහා මූල්‍යනය කරනු ලබන අතර, එයින් රුපියල් බිලියන 90 ක් ආසන්න වශයෙන් (ඇ.ඩො. මිලියන 300) දේශීය වෙළඳපොළ වෙත විදේශ ව්‍යාපාර මුදලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් රැස් කර ගනු ඇත.

රූප සටහන: 01 ණය ගැනීමේ සංයුතිය - 2027 (මුදල් ඒකකය අනුව)



රූප සටහන 02 : ණය ගැනීමේ ව්‍යූහය - 2027 (පදිංචිය අනුව)



විදේශ මූල්‍යකරණය

2027 වසරේදී, රජය රුපියල් බිලියන 640 ක මුදලක් විදේශ ණය මූලාශ්‍ර හරහා මූල්‍යනය කිරීමට සැලසුම් කර ඇත. එම මුදලින් රුපියල් බිලියන 210 ක් ප්‍රතිපත්තිමය පදනම මත ලබා දෙන මූල්‍යකරණය සඳහා ද, රුපියල් බිලියන 315 ක් ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා වන පරිදි, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික මූලාශ්‍ර ඔස්සේ ණය දෙන නියෝජිතායතනවලින් රුපියල් බිලියන 640 ක මුදලක් ලබා ගැනීමට රජය අපේක්ෂා කරයි. ඉතිරි රුපියල් බිලියන 115 ක මුදල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ 8 වන වාරිකය ලෙස ලැබීමට අපේක්ෂා කරයි.

දේශීය මූල්‍යකරණය

2027 වසර තුළ, සමස්ත මූල්‍යකරණ අවශ්‍යතාවයෙන් සියයට 90 කට ආසන්න ප්‍රමාණයක්, එනම් රුපියල් බිලියන 5,460 ක මුදලක් (භාණ්ඩාගාර බිල්පත්වල අන්තර්-වර්ෂ කල්පිරීම් රහිතව), දේශීය වෙළඳපොළෙන් සපුරා ගැනීමට පුරෝකථනය කර ඇත. මෙම මූල්‍යකරණය ප්‍රසිද්ධ වෙන්දේසි හරහා රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම මගින් සපයා ගනු ඇත.

2027 වසර සඳහා වන මධ්‍යම සහ දිගුකාලීන දේශීය ණය උපකරණය ලෙස ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර භාවිත කරනු ඇත. වසර 3 සිට වසර 15 දක්වා වූ කල්පිරීම් සහිතව ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර දේශීය වෙළඳපොළට නිකුත් කිරීම මගින් රුපියල් බිලියන 3,570 ක් රැස් කිරීමට රජය අපේක්ෂා කරන අතරම භාණ්ඩාගාර බිල්පත්වල පවතින ශේෂය රුපියල්

බිලියන 500 කින් අඩු කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව වසර 3ක් දක්වා වූ කල්පිරීමේ කාලසීමාවන් සහිතව රුපියල් බිලියන 90 ක වටිනාකමකින් යුත්, විදේශ ව්‍යාපාර මුදලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ද දේශීය වෙළඳපොළට නිකුත් කිරීමට රජය සැලසුම් කර ඇත.

කෙටිකාලීන ණය උපකරණ ලෙස වසරක කාල සීමාවක් දක්වා වූ කල්පිරීම් සහිත රුපියල් බිලියන 1,800 ක් වන භාණ්ඩාගාර බිල්පත්, භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. දේශීය වෙළඳපොළ තුළ දින 91, දින 182 සහ දින 364 ක කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට රජය සැලසුම් කර ඇත.

2027 වර්ෂය සඳහා වන වෙන්දේසි දින දර්ශනය රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් කාර්තුමය පදනමක් මත සකස් කර ප්‍රකාශයට පත්කරන අතර එය සෑම ඉදිරි මාස තුනක කාලයක් චක්‍රීයව යාවත්කාලීන කෙරේ. මෙම කාලරාමුව භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දෙකම ආවරණය වන අතර, එය 2027 වසර සඳහා වන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සහ මුදල් ප්‍රවාහ පුරෝකථනය පදනම් කර ගනිමින් සකස් කරනු ඇත.

4. යෝජිත ණය ගැනීමේ සංයුතිය

වගුව 02: යෝජිත ණය ගැනීමේ සංයුතිය - 2027

මූලාශ්‍රය	ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් බිලියන	ප්‍රතිශතය (%)
ද්විපාර්ශ්වික	160	2.6
බහුපාර්ශ්වික	480	7.9
භාණ්ඩාගාර බිල්පත්	1,800	29.5
ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර	3,570	58.5
විදේශ මුදලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර	90	1.5
එකතුව	**6,100**	**100**

රූප සටහන 03: යෝජිත ණය ගැනීමේ සංයුතිය - 2027



ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර	58.5%
භාණ්ඩාගාර බිල්පත්	29.5%
බහුපාර්ශ්වික	7.9%
ද්විපාර්ශ්වික	2.6%
විදේශ මුදලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර	1.5%

දේශීය ණය ගැනීම් — ශ්‍රී ලංකා රුපියල් බිලියන 5,460	
භාණ්ඩාගාර බිල්පත්	33.0%
භාණ්ඩාගාර බැඳුම්කර	65.4%
දේශීය ඩොලර් බැඳුම්කර	1.6%

විදේශ ණය ගැනීම් — ශ්‍රී ලංකා රුපියල් බිලියන 640	
බහුපාර්ශ්වික	75%
ද්විපාර්ශ්වික	25%

5. අධීක්ෂණය සහ වාර්තා කිරීම

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින්, ඉලක්ක සපුරා ඇති බවට සහ අවශ්‍ය ගැලපීම් සිදු කරන බව සහතික කර ගැනීම සඳහා, සමාලෝචන සමගින් වසර පුරා 2027 වාර්ෂික ණය ගැනීමේ සැලැස්මේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කරනු ඇත.

6. නිගමනය

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම - 2027 මඟින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර හරහා දේශීය මූල්‍යකරණය කෙරෙහිත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන හරහා විදේශීය මූල්‍යකරණය කෙරෙහිත් අවධානය යොමු කරයි. රජයේ මූල්‍යකරණ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වූ උපායමාර්ගික ප්‍රවේශයක් ඉදිරිපත් කරනු ලබන අතර එහිදී 2027–2031 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ නියම කර ඇති පිරිවැය සහ අවදානම් ඉලක්ක සපුරා ගැනීමට මෙම සැලැස්ම මඟින් අරමුණු කෙරේ. විචක්ෂණශීලි අවදානම් මට්ටමකට යටත්ව අවම වියදමකින් ණය ගැනීම සඳහා දේශීය හා විදේශ මූලාශ්‍රවලින් මූල්‍යකරණය විවිධාංගීකරණය කිරීමට මෙයින් සැලසුම් කර ඇති අතර, එය රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වයට සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට දායක වනු ඇත.